# අ නියමුවා

*"එනයින් සමාජය වෙනස්වීමේ දේශපාලන විප්ලවයන් හටගැනීමේ අවසාන හේතුව සෙවිය යුත්තේ මිනිසුන්ගේ මොළ තුළ නොව, එසේත් නැතහොත් සදාකාලික සත්‍යය සහ සාධාරණත්වය ගැන මිනිසුන් ලබන වඩාත් වැඩි වන අවබෝධය තුළ නොව, නිෂ්පාදන ක්‍රමයේ සහ හුවමාරුවේ වෙනස්වීම් තුළය. ඒවා සෙවිය යුත්තේ දර්ශනවාදයෙහි නොව ඒ ඒ යුගයට අනුරූප වන ආර්ථිකයෙහිය.''*

**එංගල්ස්**

**සමාජවාදය මනෝරාජ්‍යයෙන් විද්‍යාව දක්වා, 31-32 පිටු**

ISSN 1391 - 1031 | 2023 දෙසැම්බර් | 28 වෙළුම | 04 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=




**ජන බල විරෝධය නුගේගොඩ - 2023.11.18**

# ජනතාවාදී පාලනයක් තෙක් අරගලය ඉදිරියටම

**ජාතික සම්පත් විකිණීමට, ජනතාව මත පටවා තිබෙන අසීමිත බදු බරට, අත්‍යවශ්‍ය භාණ්ඩ මිල අසීමිතව ඉහළ දැමීමට, ප්‍රජාතන්ත්‍රවාදය හැකිළීමට එරෙහිව විරෝධය පෑම සඳහා අරඹන ලද අරගලය හුදු විරෝධය පෑමකින් පමණක් නතර නොවී දූෂිත පාලකයන් පලවා හැර ජනතාවාදී පාලනයක් ගොඩනැගීම දක්වා ඉදිරියට ගෙන යන බව ජාතික ජන බලවේගය අවධාරණය කරයි.**

ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා මේ බව ප්‍රකාශ කළේ පසුගිය 18වැනි දින පැවැති විරෝධතා පෙළපාලියෙන් අනතුරුව නුගේගොඩ නගරයේදී පැවති දැවැන්ත ජන බල විරෝධය රැලිය අමතමිනි.

"අයවැය ඉදිරිපත් කරලා රනිල් වික්‍රමසිංහ කිව්වේ කොට්ටඋරයක සේ කනපිට හරවන බවයි. මීට මාස කිහිපයකට කලිනුත් රනිල් කොට්ටඋරය අනෙක් පැත්ත හැරවූ බව කිව්වා. දෙපාරක් කොට්ට උරය පැත්ත හැරෙව්වම දැන් තිබෙන්නේ තිබුණු පැත්තමයි. රටේ සම්පත් විකුණමින්, ණය ගනිමින් පැමිණි ගමනේ තවත් පියවරක් පමණයි. රටක සහ ලෝකයේ මිනිසුන්ගේ අවශ්‍යතාවලට අනුකූලවන පරිදි භාණ්ඩ හා සේවා නිෂ්පාදනය වෙනස් කරමින් ඉදිරියට ගෙන යන සැලැස්මක් මේ පාලකයන්ට නැහැ. හැමදාමත් කතා කළේ තේ, රබර්, පොල් අපනයන ආර්ථිකයක් ගැන. තේ, රබර්, පොල් තරමටම මේ නායකයන් පැරණියි. ලෝකයේ ඇතිවන වෙනස්කම්වලට අනුරූපී වන පරිදි තාක්ෂණය යොදාගෙන නව නිෂ්පාදන කිරීමට, අධ්‍යාපනය වෙනස් කිරීමට මේ පාලකයන් සමත් වූයේ නැහැ. ඒ නිසා ලෝකයෙන් කොන්වී, ආර්ථිකය කඩා වැටී, අපරාධවලින් ගහන වූ රටක්, පුරවැසියන්ට තමන්ගේ අත්‍යවශ්‍ය ආහාර සහ ඖෂධ ඇතුළු භාණ්ඩ සපයා ගැනීමට නොහැකි වූ රටක් බිහි වී තිබෙනවා. අප ඉදිරියේ තිබෙන්නේ මුළුමනින්ම විනාශයට පත්වූ රටක් සහ සමාජයක්. හැත්තෑ පස්වසරක ශාපය කියන්නේ මේකයි. රනිල් වික්‍රමසිංහ අයවැයෙන් ඉදිරිපත් කරන්නේ ඒ ශාපයේ දිගුවක්." අනුර දිසානායක සහෝදරයා පෙන්වා දුන්නේය.

"රනිල්ගෙන් හෝ මහින්දගෙන් හෝ ඒ පන්නයේම අනුප්‍රාප්තිකයෙකුගෙන් රට ගොඩනැගීම බලාපොරොත්තු වෙන්න බැහැ. සමගි ජන බලවේගය කියන්නේ ඔවුන්ගේ ප්‍රතිපත්තිම රනිල් වික්‍රමසිංහ විසින් ක්‍රියාත්මක කරන බවයි. රට ඉදිරියට ගෙන යා හැකි විකල්ප ආර්ථික උපායමාර්ගය තිබෙන්නේ ජාතික ජන බලවේගයට පමණයි. එසේම තීරණාත්මක ඍජු තීරණ ගෙන මේ රට පරිවර්තනය කරන්න නම්, ශක්තිමත් රාජ්‍ය දේහයකට පණ පෙවිය හැකි දේශපාලන දේහයක් ඕනෑ. දස දහස් සංඛ්‍යාත ජනතාවක් නුගේගොඩට රැස්වී පෙන්නුම් කරන්නේ ඒ දේශපාලන දේහය තිබෙන්නේ ජාතික ජන බලවේගයට පමණක් බවයි. අපි ග්‍රාම සේවා වසම් දක්වා කොට්ඨාස සභා පිහිටුවන්නේ ඡන්ද පෙට්ටියේ ඡන්ද පුරවා ගැනීම සඳහා පමණක් නොවෙයි. ගම ගොඩනැගීම දක්වා අවශ්‍ය වන දේශපාලන නායකත්වය දෙන ව්‍යුහයක් හැටියටයි.

ලෝකය සමග ඉදිරියට යන නව කථිකාවක් සමාජය සමග ගොඩනැගිය හැක්කේත් එය ක්‍රියාත්මක කළ හැක්කේත් ජාතික ජන බලවේගයට පමණයි. මේ වෙනුවෙන් ක්‍රියාකරන කොට රනිල් වික්‍රමසිංහ ඡන්දයක් දෙයිද කියලා කතිකාවක් එක පැත්තක තිබෙනවා. රනිල් වික්‍රමසිංහ දැන් අදින්නේ ගෝඨාගේ කොටයක්. රනිල් වික්‍රමසිංහගේ පාලනය ලබන වසරේ ඔක්තෝබර් 17ට පෙර අනිවාර්යයෙන් පැවැත්විය යුතු ජනාධිපතිවරණයෙන් නිමාවට පත්වෙනවා. නියමිත

*02 වැනි පිටුවට*

## 03 අන්තෝජඨා බහිජ්ජඨා...



තමන්ට අවශ්‍ය නම් දෝෂාභියෝගයක් ගෙනවිත් රනිල් ජනාධිපති ධුරයෙන් ඉවත් කිරීමට පොහොට්ටුවට හැකියාව තිබේ. එසේම මේ පාර්ලිමේන්තුව ඕනෑම මොහොතක විසුරුවා හැරීමේ බලය...

## 05 ලංකාවේ කිරි හරකාට...



තම ජාතික ආරක්ෂාව පිළිබඳ හැඟීම, බල වුවමනාව හා ආක්‍රමණකාරී පිළිවෙත මෙන්ම තම රටේ නිෂ්පාදන කර්මාන්ත පුළුල් කර විදේශීය සාරය ඇද ගැනීමේ දෘෂ්ටියෙන් බැලුවද මෙම ආයතන ඉන්දියාවට නතුවීම...

## 09 'නරුම' චින්තනයේ...

සැබෑ ලෙසම ගත් විට පුද්ගලයන් 'නරුම' තත්වයට පත්කරනු ලබන්නේ අපේ රටේ පවත්වාගෙන යනු ලබන නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමය මගිනි. මෙම ආර්ථික ක්‍රමය පදනම්ව ඇත්තේ ලාභය වෙනුවෙන් නිපදවීම හා වෙළඳාම් කිරීමත්, අසීමිත ලෙස ලාභ ලැබීමේ තෘෂ්ණාවත්,...



තරුණ.................................... 04
ජාත්‍යන්තර.......................... 06
ආර්ථිකය ............................ 07
කාන්තා................................. 08
විශේෂාංග........................... 10
වේදිකාව.............................. 11

**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# 20,000 ඇතුළු ඉල්ලීම් වෙනුවෙන් රට පුරා රාජ්‍ය සේවක විරෝධතා




සියලු සේවකයින්ට රු. 20,000ක දීමනාවක් හෝ වැටුප් වැඩිකිරීමක් ලබාදෙනු, දීමනා හෝ වැටුප් වැඩිකිරීම් 2024 ජනවාරි සිට ක්‍රියාත්මක කරනු, 2016 සිට අහිමි කර ඇති පූර්ණ විශ්‍රාම වැටුප් අයිතිය යළි ලබාදෙනු, වැන්දඹු අනත්දරු අරමුදලට වැටුපෙන් 8%ක් කැපීම නවතනු, සියලු සේවකයින්ගේ ශ්‍රේණි උසස්වීම් වහා ක්‍රියාත්මක කරනු යන ප්‍රධාන ඉල්ලීම් වෙනුවෙන් පසුගිය 27 දින රට පුරා රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවකයින්ගේ විරෝධතා උද්ඝෝෂණ ව්‍යාපාරයක් පැවැත්විණි.

රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා වෘත්තීය සමිති එකමුතුව මගින් මෙම විරෝධතාවය පැවැත්වන ලද අතර කොළඹ සෙත්සිරිපාය ඉදිරිපිට පැවති විරෝධතාවය සඳහා වෘත්තීය සමිති එකමුතුව වෙනුවෙන් චන්දන සූරියආරච්චි සහෝදරයා ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයෝ සහ ක්‍රියාකාරීහු විශාල පිරිසක් සහභාගි වූහ.

# වරාය සමුපකාර බැංකුවෙන් දරුවන්ට ශිෂ්‍යත්ව



'ඔබේ මුදල් ඔබේ දරුවාට' තේමාවෙන් 2021 වසරේ උසස් පෙළ සමත් වී විශ්වවිද්‍යාල වරම් ලද දූ දරුවන් වෙනුවෙන් සමස්ත ලංකා වරාය පොදු සේවක සංගමයේ පාලනය යටතේ තිබෙන වරාය සමුපකාර බැංකුව මගින් සංවිධානය කරන ලද ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය පසුගියදා කොළඹ විශ්වවිද්‍යාලයීය නව කලාගාරයේදී සිදුකෙරිණි. මේ සඳහා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක, සමුපකාර දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්තුමා, සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ලේකම් නිරෝෂන් ගොරකානගේ, වරාය සමුපකාර බැංකුවේ සභාපති හා වරාය අධිකාරියේ පරිපාලන කළමණාකරු නෙළුම් අනවරත්න ඇතුළු වරාය සමුපකාර බැංකුවේ නිලධාරීහු සහ ශිෂ්‍යත්වලාභීහු මෙම අවස්ථාව සඳහා එක්ව සිටියහ.

# දුම්රිය තාක්ෂණ ශිල්පීන්ගේ 15 වැනි වාර්ෂික සමුළුව මුළුදෙයි



දුම්රිය තාක්ෂණ ශිල්පී සංගමයේ 15 වැනි වාර්ෂික සමුළුව ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයාගේ හා දුම්රිය තාක්ෂණ ශිල්පී සංගමයේ ප්‍රධාන ලේකම් එම්.ඒ. රත්නසිරි සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් දෙමටගොඩ ප්‍රධාන ඉංජිනේරු සාහිත්‍ය හා ක්‍රීඩා ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා සමස්ත ලංකා දුම්රිය සේවකයින්ගේ පොදු සේවක සංගමයේ ලේකම් එස්.පී. විතානගේ සහෝදරයා ඇතුළු දුම්රිය තාක්ෂණ සේවාව නියෝජනය කරමින් වෘත්තීය සමිති සාමාජිකයෝ රැසක් සහභාගි වූහ.

# විකිණීමට එරෙහිව තැපෑලේ වැඩවර්ජනයක්



රනිල් - රාජපක්ෂ ආණ්ඩුව විසින් IMF කොන්දේසි අනුව තැපැල විකිණීමට එරෙහිව පසුගිය පසුගිය 08 - 09 දෙදින තුළ පැය 48ක වැඩවර්ජනයක් සියලු තැපැල් සේවකයෝ ඒකාබද්ධව ක්‍රියාත්මක කළහ. මෙම වැඩ වර්ජනය කැඳවනු ලැබ තිබුණේ ඒකාබද්ධ තැපැල් වෘත්තීය සමිති පෙරමුණ විසිනි. එසේම නුවරඑළිය තැපැල් කාර්යාල ගොඩනැගිල්ල විදේශීය සමාගමට විකිණීමට තීරණය කිරීමට විරෝධය දක්වමින් නුවරඑළිය තැපැල් කාර්යාලය ඉදිරිපිට දැවැන්ත විරෝධතාවයක්ද පැවැත්වීමට කටයුතු කෙරිණි. මේ සඳහා සිවිල් සංවිධාන, වෘත්තීය සමිති නියෝජිතයින් විශාල පිරිසක් එක්ව සිටි අතර මෙහිදී රැස්ව සිටි පිරිස අමතූ ලංකා තැපැල් සේවා සංගමයේ සභාපති ජගත් මහින්ද සහෝදරයා පැවසුවේ නුවරඑළියේ ජනතාවගේ අභිමානය වන තැපැල් ගොඩනැගිල්ල විකිණීමට ඉඩ නොදෙන බවය. තැපැල් සේවය විකිණීම රනිල් - රාජපක්ෂ ආණ්ඩුවේ අවසානය ඉක්මන් කරන බවත් මීට එරෙහිව 27,000ක තැපැල් සේවකයින් ඇතුළු සියලු ජනතාව එක් කර ගනිමින් තම සටන ජයග්‍රහණය කරන බවත් ඔහු අවධාරණය කළේය.

*2023.11.22 ජාතික ජන බලවේගයේ නීතිඥයෝ සංවිධානය සහ අදිටන විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමූහිකයේ ඒකාබද්ධ මාධ්‍ය හමුව*

# ආණ්ඩුවේ නිහීන ක්‍රියාමාර්ගවලට ජාතික ජන බලවේගය බය වෙන්නේ නැහැ

### ජාතික ජන බලවේගයේ නීතිඥයෝ සංවිධානයේ නීතිඥ සුනිල් වටගල



ජාතික ජන බලවේගය පසුගිය කාලය පුරාම සැලකිය යුතු ජනතා ජයග්‍රහණයක් ලබමින් ඉදිරියට එමින් සිටිනවා. ජන වරමක් නැති රනිල් රාජපක්ෂ ආණ්ඩුව ජාතික ජන බලවේගයේ ගමන අඩපණ කරන්න අදේශපාලනික, තුච්ඡ ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවා. ආණ්ඩුව තම තමන්ට පක්ෂපාතී කොටස් උපයෝගී කර ගනිමින් යම් යම් බලපෑම් සිදුකරමින් සිටිනවා. මාධ්‍ය හමුවට සහභාගී වන සම්පත් තුයියකොන්තා මහත්මාට ගුවන් හමුදාව තුළ වාචිකව බ්ලැක් ලිස්ට් කර තිබුණා. මේ සම්බන්ධයෙන් අපි ශ්‍රේෂ්ඨාධිකරණයට FCR 132/2023 කියන නඩුව ගොනුකළා. ගෝඨාභය රාජපක්ෂ, සරත් ෆොන්සේකා, සරත් වීරසේකර, කමල් ගුණරත්න වගේ විශ්‍රාමික හමුදා නිලධාරීන්ට දේශපාලනය කරන්න තිබෙන අයිතිය සම්පත් තුයියකොන්තා මහත්මාට නැත්තේ ඇයි කියන ප්‍රශ්නය අපි ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනු කළා. ගුවන් හමුදාව වෙනුවෙන් පෙනීසිටි නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරියට තම පාර්ශ්වය වරදක් කර ඇති බව පිළිගන්න සිදුවුණා. ඊළඟ නඩු දිනය 2024 ජනවාරි 10වැනි දින වන විට අදාළ තහනම් කිරීම් ඉවත් කර, ඒ බව ශ්‍රේෂ්ඨාධිකරණයට ලිඛිතව දැනුම් දෙන්න නියමිතයි.

ඉන් නොනැවතී මේ සාමූහිකයට යම් යම් බලපෑම් සිදුකරමින් සිටිනවා. සම්පත් තුයියකොන්තා මහත්මාගේ මූලික අයිතීන් උල්ලංඝනය කර ඇති බව වගඋත්තරකරුවන් පිළිගෙන තිබියදීත් තවදුරටත් බලපෑම් සිදුකරමින් පවතිනවා. අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත්වයි දේශපාලනය කරන්නේ. ඒ අයිතියට නෛතිකව අභියෝග කරන්න කිසිවෙකුටත් බැහැ. විශ්‍රාමික සාමූහකයේ පවුල්වල අයට බලපෑම් කිරීමේ අදහසින් විවිධ බාධා සිදුකරනවා. ආණ්ඩුවේ මේ නිහීන ක්‍රියාමාර්ගවලට ජාතික ජන බලවේගය බය වෙන්නේ නැති බව අපි අවධාරණය කරනවා. මේ සාමූහිකයට සිදුකරන සියලු කෙනෙහිලිකම් සම්බන්ධයෙන් ජාතික ජන බලවේගයේ නීතිඥයෝ සංවිධානය පෙනී සිටිනවා. ඒ සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආණ්ඩුවේ බියගුළු, නිහීන තුච්ඡ, වැඩවලින් මර්දනය කළ නොහැකි බවත් ආණ්ඩුවේ මේ ක්‍රියාමාර්ග වහාම නතර කරන ලෙසත් අවධාරණය කරනවා.

# කුමන බලපෑම් ආවත් අපේ රට වෙනුවෙන් ඉදිරියටත් ක්‍රියාකරනවා

### විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමූහිකයේ ප්‍රධාන සම්බන්ධීකාරක විශ්‍රාමික මේජර් ජනරාල් අරුණ ජයසේකර



ජාතික ජන බලවේගයේ අදිටන විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමූහිකය විශාල වෘක්ෂයක් බවට දැන් ගොඩනගාගෙන තිබෙනවා. රටට සිදුකර තිබෙන වින්නැහිය හමුවේ විශ්‍රාමිකයන් හැටියට අහක බලාගෙන ඉන්න අපට බැහැ. රට වට්ටවා තිබෙන තත්වයෙන් ගොඩගැනීමට මේ රටේ දූ දරුවන් වෙනුවෙන් හොඳ හෙටක්, හොඳ රටක් නිර්මාණය කිරීමට වෘත්තීය මට්ටමින් ඉහළම දායකත්වයක් ජාතික ජන බලවේගයට ලබාදෙන්නයි අපි මේ සාමූහිකය පිහිටුවා ගත්තේ. නීත්‍යානුකූලව අපි කටයුතු කරගෙන යන අතර, මේ සාමූහිකයේ සාමාජිකයින්ට විවිධ වාචික බාධාවල් එල්ල කොට තිබෙනවා. ජාතික ජන බලවේගයට තිබෙන අදූෂිත, ස්වෙච්ඡාවෙන් කැපවෙන හැකියාව හඳුනාගෙනයි රට ගොඩනැගීම වෙනුවෙන් අපි මේ පක්ෂයට සම්බන්ධ වී ක්‍රියාකරන්නේ. අපට මොන බලපෑම් ආවත් අපේ රට වෙනුවෙන් ඉදිරියටත් ක්‍රියාකරන බව ස්ථිරවම ප්‍රකාශ කරනවා.

# 'අදිටන' සාමාජිකයන් ජීවිතයෙන් හෝ හෘදය සාක්ෂියෙන් විශ්‍රාම ගියේ නැහැ

### ජාතික ජන බලවේගයේ නීතිඥයෝ සංවිධානයේ නීතිඥ හර්ෂණ නානායක්කාර



ඡන්දය කල්දැමූ ආණ්ඩුව ජාතික ජන බලවේගයේ කටයුතුවලට සියලුම අංශවලින් බාධා පමුණුවන්න විවිධ උත්සාහයන් දරනවා. 'අදිටන' සංවිධානයට ආණ්ඩුව මෙතරම් බය ඇයි කියන එක අපට පැහැදිලියි. ඔවුන් විශ්‍රාම ගොස් සිටින්නේ රැකියාවෙන් විතරක් බව ආණ්ඩුව මතක තබාගන්න ඕනෑ. ජීවිතයෙන් හෝ හෘදය සාක්ෂියෙන් ඔවුන් විශ්‍රාම ගියේ නැහැ. දේශපාලනිකව ඔවුන් විශ්‍රාම ගිහින් නැහැ. රට වෙනුවෙන් රාජකාරි කාලයේදී කැපවීමෙන් කටයුතු කළ පිරිසක් මේ විදිහට ජාතික ජන බලවේගය වටා එකතු වී සිටිනවා. ඔවුන්ට එරෙහිව අනීතිකව ගෙන එන කුමන බාධාවකට හෝ අපි කිසිවෙකුත් බය වෙන්නේ නැහැ. ආණ්ඩුවේ අවශ්‍යතාවයට අනුව ඇතැම් නිලධාරීන් වාචිකව ලබාදෙන නියෝග නොපිළිනපදින ලෙස සියලු දෙනාටම මම මතක් කරනවා. ඔබලා පෙනී සිටිය යුත්තේ දේශපාලන බලයෙන් එන යන ආණ්ඩු වෙනුවෙන් නොවෙයි, රජය සහ ජනතාව වෙනුවෙන්.

ලබන ඔක්තෝබර් මාසයෙන් පස්සේ රනිල් වික්‍රමසිංහලා, රාජපක්ෂලා කවුරුත් බලයේ නැහැ. ඊළඟට පත්වෙන ආණ්ඩුව නීතියේ විධානයේ ආධිපත්‍යය, නිවැරදිව ක්‍රියාත්මක කරනවා. ජාතික ජන බලවේග යේ ආණ්ඩුවක් යටතේ ඒ කටයුතු නිවැරදිව සිදුවන බව ඔය ඉහළ නිලධාරීන්ට කාරුණිකව සිහිපත් කර දෙනවා. අනීතික නියෝග පිළිපදිමින්, දේශපාලනඥයන්ට කඩේ ගිහින් මුළු වෘත්තිය ජීවිතයම අඳුරුකර ගන්න එපා කියලා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

## ජනතාවාදී පාලනයක් තෙක්...

01 පිටුවෙන්

පරිදි ජනාධිපතිවරණය නැති බව ජනතාවට තහවුරු වුවහොත් ලබන සැප්තැම්බර්වලටත් පෙර රනිල් වික්‍රමසිංහ ගෙදර යවනවා. අපි ආණ්ඩුව පළවා හරින්නේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් ගොඩනැගීමේ සැලසුම සහිතවයි. ඉතාමත් වැදගත් සන්ධිස්ථානය ජනාධිපතිවරණයයි. විශාල ලෙස අපේක්ෂාභංගත්වයට පත්වූ ජනතාවක් අප කෙරෙහි විශාල විශ්වාසයක් තබා තිබෙනවා. ඔවුන් සම්බන්ධයෙන් අපට තිබෙන්නේ ඉතාමත් බැරෑරුම් වගකීමක්.

"අපේ රටේ දේශපාලනය ඉතාමත් නිශ්චිත තීරණාත්මක කඩඉමකට ගමන් කරමින් තිබෙනවා. ලබන අවුරුද්දේ නොවැම්බර් වනවිට අලුත් ආණ්ඩුවක්, අලුත් පාලනයක පිහිටුවන බවට අපි ඔබට සහතික වෙනවා. රනිල් වික්‍රමසිංහ පසුගියදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ මේ දුෂ්ට විනාශකාරී පාලනයේ අවසන් අයවැය බවට පත්කරන බවට සහතිකයි.

අපි පිහිටුවන ආණ්ඩුව වටා ලෝකයේ නව දැනුම පෙළගස්වා, ලෝකය සමග තරඟ කළ හැකි ආර්ථිකයක් ගොඩනැගිය යුතුයි. සමාජ සාධාරණත්වය, යුක්තිය, කාර්යක්ෂමතාවය, සෑම පුරවැසියාගේම ගෞරවය සහතික වන රටක් ගොඩනැගීම වෙනුවෙන් අපි සියලු දෙනාම එකාවන්ව ක්‍රියාකරමු." අනුර දිසානායක සහෝදරයා ජනතාවට ආරාධනා කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# අයවැය ලේඛනයේ නුදුටු පැත්ත

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මුදල් ඇමතිවරයා ලෙස 2024 මුදල් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය පිළිබඳ විවාදය මේ දිනවල පාර්ලිමේන්තුවේ පැවැත්වේ. මෙම විවාදයේදී පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයෙත්, සජිත්ගේ නිල විපක්ෂයෙත් මන්ත්‍රීවරුන්ගෙන් වැඩිපුරම ඇසෙන්නේ අයවැයට අදාළ නොවන කථාය. මඩගැසීම්, බැනගැනීම්, අවලාද නැගීම්, තර්ජනය කිරීම්වලින් අයවැය විවාදය පිරී තිබේ. අප මේ කථාකිරීමට යන්නේ ඒ ගැන නොවේ. අයවැය සම්බන්ධයෙන් සමාජයේ අවධානය නොමැති පැත්ත ගැනය.

අයවැය ලේඛනයක් යනු ඉදිරි වර්ෂය සඳහා ආදායම් හා වියදම් තුලනය කිරීමේ ලියවිල්ලක් පමණක් නොවේ. එය රටක ආර්ථික උපායමාර්ගයේද එක් කොටසකි. එහෙත් අපේ රටේ අයවැය යනු තනිකරම ඉලක්කම් හරඹයකි.

අයවැය ලේඛනයක් ඉදිරිපත් වූ පසු හැම විටම රට තුළත් පාර්ලිමේන්තුවේත් විවාදයට ගැනෙන්නේ අයවැය ලේඛනය තුළ ලියා ඇති කරුණු පිළිබඳවය. ඒ ඒ විෂයන්ට වෙන් කළ මුදල් ප්‍රමාණ ගැන, රජයේ ආදායම සඳහා බදු පැනවීම් ගැන, කප්පාදු කිරීම් ගැන කථා වේ. එහෙත් මෙලෙස ඉදිරිපත් කොට සම්මත කර ගන්නා අයවැය ලේඛනය ක්‍රියාවට නැගුණේද යන්න යළි සමාලෝචනයක් කිසි විටෙක සිදුවන්නේ නැත. එවැනි ක්‍රමවේදයක්ද නැත. සම්මත කරන ලද අයවැයට අනුව කටයුතු කිරීමේ වගකීමක් ආණ්ඩුවට නැත. එය ප්‍රශ්න කරන ක්‍රමයක්ද නැත.

මේ තත්වය යටතේ ආණ්ඩුවලට අයවැය ලේඛනයේ ඕනෑම දෙයක් ලිවීමට හැකිය. මන්ද ඒ පිළිබඳව වසර අවසානයේ වගවීමේ ක්‍රමයක් නැති නිසාය. අයවැය ලේඛනයෙන් ඒ ඒ කාර්යන්ට වෙන් කළ මුදල් සැබෑ ලෙසම වෙන් වූයේද එම මුදල් අදාළ කාර්යට යෙදුවේද, ආණ්ඩුවේ ආදායම් අපේක්ෂිත ලෙස ලැබුණේද නැද්ද නැතිනම් ඒ කුමක් නිසාද ආදී කිසිවක් යළි පසු විපරමකට භාජනය නොවේ.

අනෙක් අතට අයවැය ඉදිරිපත් කරද්දී 'ජනතාව වෙනුවෙන් මුදල් වෙන්කළේය'යි ඒ මොහොතේ ආණ්ඩු විසින් පම්පෝරි ගසන සමහර යෝජනා ඉටු වූයේදැයි කිසිවකු සොයන්නේ නැත. රනිල්ගේ වර්තමාන අයවැය ලේඛනයේ අලුතින් විශ්වවිද්‍යාල රැසක් පිහිටුවීමට යෝජනා කරනු ලැබ තිබේ. එහෙත් වසර අවසානයේ එය සිදුවූයේදැයි විමසීමේ ක්‍රමයක් නැත. ඒ වන විට අයවැය යෝජනා ආණ්ඩුවටත් මතක නැත; රටේ ජනතාවටත් මතක නැත; ජනමාධ්‍යවලටත් මතක නැත. මෙතෙක් සිදු වූයේ එයයි.

දැන් අයවැය තුළ එක් එක් විෂයන්ට, එක් එක් අමාත්‍යාංශවලට මුදල් වෙන් කොට සම්මත කර ගත්තද ඉතිහාසය පුරාම සිදුවී ඇත්තේ ඊට අනුව කටයුතු කිරීම නොවේ. ආණ්ඩුවේ වියදම් සඳහා, රජයට භාණ්ඩ ගෙන්වීම සඳහා, ඇමතිවරුන්ගේ ජනාධිපතිගේ වියදම් සඳහා අතරමගදී පරිපූරක ඇස්තමේන්තු ආදී ක්‍රමවලින් ආණ්ඩුව අමතර මුදල් වෙන්කර ගනී. ඒ අතර ජනතාවට ප්‍රතිලාභ ලැබෙන සමහර විෂයන්ට වෙන් කළ මුදල්ද පසුව ලබා නොදී හෝ අඩුකොට එයද කොල්ලකනු ලැබේ.

එපමණක් නොවේ; අතරමග බදු බර වැඩිකිරීමද සිදු කරනු ලැබේ. ඒ අනුව ජනතාවට අයවැයෙන් නිල වශයෙන් වෙන්කළ දේ පවා නොලැබෙන අතර ජනතාවගෙන් අයකර ගැනීම් වැඩිපුර කරනු ලැබේ. සෑම විටම අයවැය ලේඛනයක් නිල ලෙස අනුමත කර ගත්තද රටත් ආර්ථිකයත් හසුරුවන්නේ එයට අනුව නොවන බව පෙනේ.

එවැනි තත්වයක් තුළ ඉදිරිපත් කළ අයවැය ගැන වාද විවාද කිරීම ඵල රහිතය. මන්ද, කෙතරම් වාද විවාද කොට සම්මත කළද අයවැය ලේඛනයට අනුව මූල්‍ය පාලනය සිදු නොවන නිසාය. අයවැය ලේඛනයේ සම්මත කළ යොජනාවලට වගවීමේ නිල නීතිමය බැඳීමක් ආණ්ඩුවට නැත. එවැනි තත්වයක් තුළ අයවැය ලේඛනයක් යනු ඉදිරිපත් කළ මොහොතේ පමණක් කථා වන ඉන්පසු අමතක කර දමනු ලබන වගවීමක් නැති ලියවිල්ලක් පමණක් වේ.

එබැවින් පක්ෂයක් බලය ගැනීම සඳහා මැතිවරණයකදී ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්ති ප්‍රකාශනයට වගවීමේ නීතියක් අවශ්‍ය වනවා මෙන්ම, සම්මත කරනු ලැබූ අයවැය ලේඛනයට මුළුමනින්ම වගවීමේ නීතියක්ද අවශ්‍ය වේ. රට වෙනස් කිරීමේදී එම වෙනස්කම්ද සිදු විය යුතුව තිබේ.

# ආණ්ඩුව, අන්තෝජඨා බහීජඨා තත්වයක!

වර්තමාන රනිල් - රාජපක්ෂ පාලනයේ තත්වය එන්න එන්නම නරක අතට හැරෙමින් තිබේ. එක් අතකින් ආණ්ඩුව ජනතාවගෙන් වේගයෙන් ප්‍රතික්ෂේප වෙමින් තිබේ. ඒ, ආණ්ඩුවට සම්බන්ධ සියලු දේශපාලන පක්ෂ සමගය. අනික් අතින් ආණ්ඩුව තුළ හා ආණ්ඩුවේ පක්ෂ තුළ ඇති අභ්‍යන්තර අර්බුද ඔඩුදුවමින් තිබේ.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ධුරයට පත්ව වසර 03ක් යාමට මත්තෙන්ම රාජපක්ෂ පාලනයට එරෙහිව ජනතා විරෝධය ඇවිළිණි. එම විරෝධයේ ප්‍රතිඵලය වූයේ ගෝඨාභයට ජනාධිපති තනතුර අතහැර පලායාමට සිදුවීමය. රාජපක්ෂවරුන් විසින් ජනවරමක් නොතිබූ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිකමට පත්කර ගත්තේ ගෝඨාභයගේ පලායාමෙන් ඇතිවූ පුරප්පාඩුව සඳහාය.

රනිල් ජනාධිපති වන විට සමාජයේ සමහර දෙනෙක් රනිල් රට ගොඩ ගනු ඇතැයි සිතුවේ ඔහු දුන් පොරොන්දු විශ්වාස කරමිනි. එහෙත් මේ වන විට රට වේගයෙන් විනාශය කරා, ආර්ථික අගාධයක් කරා ගමන් කරමින් තිබේ. රනිල් විශ්වාස කළ ජනයාද දැන් එම විශ්වාසය අතහැර ගෙන ඇත. ඒ අනුව මේ වනවිට ආණ්ඩුව පිළිබඳ ජනතාවගේ විශ්වාසය ඉතා බරපතළ ලෙස පහත වැටී තිබේ.

මෑතකදී වෙරිටේ රිසර්ච් ආයතනය විසින් කරන ලද ජනමත සමීක්ෂණයක ප්‍රතිඵල ප්‍රසිද්ධ කරනු ලැබ තිබිණි. එයට අනුව ආණ්ඩුවට තිබූ ජනතා ප්‍රසාදය මේ වසරේ ආරම්භයට සාපේක්ෂව 21% සිට 09% දක්වා ඇදවැටී තිබේ.

පොදු ජනයා වේගයෙන් ආණ්ඩුව අතහැර යමින් සිටී; ආණ්ඩුව පිළිබඳ විශ්වාසය නැති කර ගනිමින් සිටී. ජනතාවගේ විශ්වාසය බිඳවැටී ඇත්තේ ආණ්ඩුව පිළිබඳව පමණක් නොවේ. ආණ්ඩුවට සම්බන්ධ එජාප, පොහොට්ටු ආදී පක්ෂ පිළිබඳවද, ඉන් ඉවත්ව ගිය කුඩා කල්ලි හා සජිත්ගේ විපක්ෂය පිළිබඳවද ජනතාවගේ විශ්වාසය බිඳ වැටී තිබේ. එහි ප්‍රතිඵලය වී තිබෙන්නේ අලුතින්ම කරන ලද ජනමත සමීක්ෂණයකදී අනුර දිසානායක සහෝදරයාට ඇති ජනතා කැමැත්ත 51% දක්වා වැඩිවී තිබීමය.

ආණ්ඩුව පිළිබඳවත්, ආණ්ඩුවේ පක්ෂ පිළිබඳවත් ජනතාවගේ විශ්වාසය වේගයෙන් බිඳවැටෙමින් තිබියෙදී ආණ්ඩුව තුළ හා ආණ්ඩුවේ ප්‍රධාන පාර්ශවය වන පොහොට්ටුව තුළ අභ්‍යන්තර ගැටලු හා ප්‍රතිවිරොධතා රැසක් මතුවී ඇත. මේ තත්වය විසින් ආණ්ඩුව 'අන්තෝජඨා බහිජඨා' එනම් ඇතුලත් ගැටලු පිටත් ගැටලු තත්වයට පත්කරනු ලැබ තිබේ.

මෙවර අයවැය ලේඛනය ඉදිරිපත් කරමින් සිදුකළ කථාවේදී ලබන වසරේ ජනාධිපතිවරණය පැවැත්වෙන බව ප්‍රකාශ කළ රනිල් වික්‍රමසිංහ යළිත් වරක් පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කළේ ලබන වසරේ මැතිවරණ දෙකක් තිබෙන බවය. ඒ, ජනාධිපතිවරණය හා මහ මැතිවරණය වීමට




පුළුවන. මන්ද ලබන වසරේ ඔක්තෝබර් මස මැද අනිවාර්ය ලෙසම ජනාධිපතිවරණය පැවැත්විය යුතු අතර ඉන් ජයගන්නා අපේක්ෂකයා පාර්ලිමේන්තුව විසුරුවා හරින නිසා පාර්ලිමේන්තු මැතිවරණයද ලබන වසරේම පැවැත්වීමට සිදුවන බැවිනි.

එහෙත් ගැටලුව වී තිබෙන්නේ කුමක්ද? වර්තමානයේ ජනතාවත් රටත් මුහුණදී සිටින විශාලතම ආර්ථික අර්බුදය හා ඉන් ජනතාවට දැනී ඇති ආර්ථික පීඩාව නිසා ජනතාව ආණ්ඩුව සමග කෝපයෙන් සිටීමය. එබැවින් මේ වනවිටත් ආණ්ඩුව පිළිබඳ ජනතා විශ්වාසය බරපතළ ලෙස බිඳී ඇති තත්වය තුළ ආණ්ඩුවට ඊළඟ මැතිවරණ

> තමන්ට අවශ්‍ය නම් දෝෂාභියෝගයක් ගෙනවිත් රනිල් ජනාධිපති ධුරයෙන් ඉවත් කිරීමට පොහොට්ටුවට හැකියාව තිබේ. එසේම මේ පාර්ලිමේන්තුව ඕනෑම මොහොතක විසුරුවා හැරීමේ බලය දැන් රනිල් සතුව තිබේ. එහෙත් මේ දෙපාර්ශවයම ඉන් එකක්වත් කරන්නේ නැත. මන්ද මේ සියලු දෙනාටම බලය පවත්වාගෙන යාමට ඇති වුවමනාව හා බලය අහිමි වීමට ඇති බිය අන් සියලු ප්‍රතිවිරෝධයන්ට වඩා ප්‍රබල නිසාය.

හොඳ වන්නේ නැත. වෙනත් කාලවලදී ඡන්දයක් ළංවන විට ආණ්ඩුව මහජන මුදල්, රජයේ මුදල් වැය කරමින් විවිධ උත්සව, මුල්ගල් තැබීම්, විවෘත කිරීම්, බඩු බෙදීම් ආදිය කරමින් ජනතාව රවටා යළි තමන්ටම ඡන්ද ගැනීමට ක්‍රියාකර තිබේ. එහෙත් දැන් එය කිරීමට ආණ්ඩුවේ පක්ෂවලට හැකියාවක් නැතිවී තිබේ. මන්ද එවැනි උත්සවවලට ජනතාව සහභාගි නොවීමත්, සමහර උත්සවවලදී ජනතාව ඇමතිවරුන්ට, ආණ්ඩුවේ ප්‍රධානීන්ට දැඩි ලෙස විරෝධය පළ කිරීමත් නිසාය.

මෑතකදී ක්‍රීඩා පිටියක් හා ප්‍රේක්ෂකාගාරයක් විවෘත කිරීමට ගිය හිටපු ක්‍රීඩා අමාත්‍යවරයා ඇතුළු ප්‍රාදේශීය දේශපාලකයන්ට ඉබ්බාගමුව මධ්‍ය මහා විදුහලේ ගුරු මණ්ඩලය දැක්වූ විරෝධය මීට එක් උදාහරණයක් පමණි. එවැනි සිදුවීම් රැසක් නිසා දැන් මැති ඇමතිවරුන් ජනතාව හමුවීමට යාම අත්හැර දමා තිබේ. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පැවැත් වූ, නාමල් රාජපක්ෂ ඇතුළු ප්‍රබලයන් සහභාගි වූ ජනහමු, ආසන සමුළු, දිස්ත්‍රික් සමුළු ආදියද ජනතා සහභාගිත්වය දුර්වලවීම නිසා අතහැර දැමීමට සිදුවිය. එජාප හා සජබ මහජන හමුද එම තත්වයට වැටී තිබේ.

මෙලෙස ජනතාවගේ සහය නොමැතිවීම නිසාත්, ජනතා විරෝධය එල්ලවීම නිසාත් දේශපාලන ක්‍රියාකාරකම් දුර්වල වී පාර්ලිමේන්තුවේ කථාවලට පමණක් සීමාවීමට ආණ්ඩුවට සිදුව තිබියෙදී ආණ්ඩුවේ අභ්‍යන්තර ගැටුම් විසින්ද ඔවුන් තවත් අර්බුදයට පත්කර තිබේ.

පාර්ලිමේන්තුවේ එක මන්ත්‍රීකමක් පමණක් තිබූ රනිල් ජනාධිපති තනතුරට පත් කළේ රාජපක්ෂවරුන්ගේ ආණ්ඩුව විසිනි. ඒ සඳහා පාර්ලිමේන්තුවේ පැවැති ඡන්දයේදී මන්ත්‍රීවරු 130කට වැඩි ප්‍රමාණයක් රනිල් වෙනුවෙන් අත උස්සා ඡන්දය දෙන ලදී. එහෙත් ජනාධිපති වීමෙන් පසු රනිල් දැන් හැසිරෙන්නේ තමා සතු විධායක බලය උපයෝගී කර ගනිමිනි. රනිල් ජනාධිපතිකම කරන්නේ රාජපක්ෂවරුන් නොසලකාය. ඒ ගැන විටින් විට ප්‍රසිද්ධියේ මැසිවිලි නැගුවද රාජපක්ෂ පාලනයට ඒ පිළිබඳව දැන් කළ හැකි යමක් නැත.

ආණ්ඩුවේ සමහරු රනිල්ව ප්‍රසිද්ධියේම විවේචනය කරද්දී සමහරු රනිල් සමග ඩීල් දමා සිටිති. මෙහි හාස්‍යජනක කරුණ වන්නේ රනිල්ගේ ක්‍රියාකාරකම් ප්‍රසිද්ධියේම විවේචනය කරන අය පවා පාර්ලිමේන්තුවේදී රනිල්ට පක්ෂව අත එසවීමය. ඉන් කියවෙන්නේ රනිල් හා රාජපක්ෂවරුන් ඉතාම හොඳ මිතුරුකමක සිටින බව නොවේ; බලය වෙනුවෙන් මේ පාර්ශ්ව දෙකටම එකිනෙකා මත යැපීමටත් එකිනෙකා ආරක්ෂා කිරීමටත් සිදුව තිබීමය. යථාර්ථය එයයි.

තමන්ට අවශ්‍ය නම් දෝෂාභියෝගයක් ගෙනවිත් රනිල් ජනාධිපති ධුරයෙන් ඉවත් කිරීමට පොහොට්ටුවට හැකියාව තිබේ. එසේම මේ පාර්ලිමේන්තුව ඕනෑම මොහොතක විසුරුවා හැරීමේ බලය දැන් රනිල් සතුව තිබේ. එහෙත් මේ දෙපාර්ශවයම ඉන් එකක්වත් කරන්නේ නැත. මන්ද මේ සියලු දෙනාටම බලය පවත්වාගෙන යාමට ඇති වුවමනාව හා බලය අහිමි වීමට ඇති බිය අන් සියලු ප්‍රතිවිරෝධයන්ට වඩා ප්‍රබල නිසාය.

පසුගිය නොවැම්බර් 27දා ජනාධිපති රනිල් විසින් ක්‍රීඩා ඇමති ධුරය දැරූ රොෂාන් රණසිංහ ක්‍රීඩා ඇමතිකමෙන් ඉවත් කළේය. ඒ, රොෂාන් ඇමති ධුරයේ සිටියදී රනිල්ගේ අවසරයකින් තොරව ක්‍රිකට් සඳහා අන්තර් පාලන කමිටුවක් පත්කිරීම හා පසුව සාගලව විවේචනය කිරීම නිසාය. එහෙත් ඒ පිළිබඳව යමක් කිරීමට රොෂාන්ට මෙන්ම පොහොට්ටුවටද හැකියාවක් නැත. ආණ්ඩුවේ ප්‍රතිවිරෝධය මේ මගින් රටට හෙළි වේ. හිටපු ක්‍රීඩා ඇමතිවරයාද හොඳ පුද්ගලයෙක් නොවේ. ඔහු මේ අර්බුදයන්ගේ වගකීමෙන් පෞද්ගලිකව නිදහස් වීමට උත්සාහ කරමින් සිටී. එහෙත් මේ සියල්ලෝම මේ ව්‍යසනයේ වගඋත්තරකරුවන් බව අමතක නොකළ යුතුය.

කෙසේ වෙතත් ආණ්ඩුව ජනතාවගෙන් ප්‍රතික්ෂේප වෙමින් තිබීමත් ආණ්ඩුවේ පක්ෂවල 11 වැනි පිටුවට




# පිළිමයට සිවුරු ඇන්දවීම හා ජනතාව ගොනාට ඇන්දවීම

මේ දවස්වල බුකියම තැඹිලි පැහැ ගෙන තිබෙන්නේ අවුකන පිළිමයට සිවුරක් ඇන්දවීම නිසාය. ආගමික කටයුත්තක් වෙනුවෙන් ඇන්දවූ සිවුර එදිනම පැය කීපයකට පසු ගලවා ඉවත් කළ බව විහාරාධිකාරී හිමියන් විසින් පවසා ඇත. නමුත් බොහෝ දෙනා තාමත් සිටින්නේ සිවුරු ලාගෙනය.

මේ අතරතුර ආණ්ඩුවේ ඇන්දිල්ල ජයටම සිදුවිය. ක්‍රීඩා ඇමතිවරයා ඉවත්කර, නව ඇමති ධුර දෙකක් පිරිනැමුවේය. ජලය විකිණීමට සැලසුම් කරන යෝජනාවකට කැබිනට් අනුමැතිය ලැබුණේය. විදුබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය කරන යෝජනා පාර්ලිමේන්තුවේ සම්මත කරගැනීමට නියමිතය. ජනාධිපතිට අවැසි නව පොලිස්පති පත්කිරීම තේරීම්කාරක සභාවට වංගුවක් ගසා විකෘති පාර්ලිමේන්තුව මගින් සිදුකරගැනීමට සැලසුම් සකස් වෙමින් ඇත. ජනතාව ගොනාට ඇන්ඳවීම ඇත්තේ මේ තුළය.

ජනතාවගේ සමාජ මාධ්‍ය භාවිතය වත්මන් පාලකයින්ට මහත් හිසරදයක් වී ඇත. මන්ද ඒ තුළින් දැවැන්ත මහජන විරෝධයක් ආණ්ඩුවට එල්ල වෙමින් තිබීමය. තමන් ගන්නා සෑම ජනතා විරෝධී ක්‍රියාමාර්ගයක්ම සමාජ මාධ්‍ය හරහා හෙළිදරව් වීමත්, ඒ තුළ විවේචනයට ලක්වීමත් ආණ්ඩුවට මහත් හිසරදයක් වී ඇත. මේ නිසාම ආණ්ඩුව සමාජ මාධ්‍ය මර්දනය කිරීම වෙනුවෙන් නීති පවා ගෙන ඒමට සැලසුම් කරන අතරතුර, ජනතාවගේ අවධානය ආණ්ඩු විරෝධයෙන් වෙන්කර සිවුරු ඇන්දවීම වැනි මාතෘකා වෙත සමස්ත බුකියම යොමුකිරීමට උත්සාහ දැරෙමින් ඇත. නැතහොත් ජනතාව ගොනාට ඇන්දවීමට උත්සාහ දරයි.

මෙසේ ජනතාව ගොනාට ඇන්දවීම පිටුපස මහා බේදවාචකයක් ඇත. 2024 අයවැය මගින් බදු වැඩිකර, බදු අය නොකළ භාණ්ඩ හා සේවා මත බදු අය කිරීමට සැලසුම් කර ජනතාවගේ බොටුව මිරිකීමට සූදානම් කර අනෙක් පසින් ජනතා මුදලින් නඩත්තු වන ඇමැති රොත්ත වැඩි කිරීමට කටයුතු කරන්නේ, තම ජනාධිපති සිහිනය වෙනුවෙනි. පඩි වැඩි කරනවා යැයි පවසන ලොකුම ඇන්දිල්ලට රාජ්‍ය හා පුද්ගලික අංශයේ සේවකයින් හීලෑ කරගැනීමට උත්සාහ දැරෙමින් ඇත. රටේ පශු සම්පත් ක්ෂේත්‍රය නගාසිටුවීම වෙනුවෙන් ඇති ඉඩම් අක්කර තිස්දහසකට ආසන්න ප්‍රමාණයක්, අපේ රටේ ජල සම්පත ඇතුළු බොහෝ සම්පත් බහුජාතික සම්පත් වෙත විකුණාදැමීම, මේ ඇන්ඳවීම පිටුපස නොපෙන්වන මහා බේදවාචකයයි.

මේ නිසා ඇත්ත බේදවාචකය ජනතාව වෙත ගෙනයාමට හා එයට විරෝධය දැක්වීමට, සංවිධානය කිරීමට ඇති සමාජ මාධ්‍ය වේදිකාවන්, සංවිධාන, පුද්ගලයින්, දේශපාලන හා සිවිල් සංවිධාන ආණ්ඩුවේ බොරු ඇන්ඳිලි වලින් මිදී, ඇත්ත සමාජ ප්‍රශ්න වෙනුවෙන් අවධානය යොමු කිරීම, යොමුකරවීම කාලෝචිත මෙන්ම විද්‍යාත්මක වන්නේය.

## ඉකුත් වස ගෙවා සිට...

පිරිවරාගෙන
මහා දන සෙන්
ඉකුත් වසරක්
වෙහෙසකර ...
වෙමින් අනලස්
කුළුණු ගුණයෙන්,
නපුරු දුර්ගුණ
අඳුරැකර ...
ඉදිත් මතුවන
තවත් වසකට
නවමු බිම වෙත
එතෙරකර ..
තනමු සුපහන්
නැවුම් ලොවකට
නොවී කිකලෙක
විපිලිසර ..

# ක්‍රිකට් වැනසූ දූෂිත දේශපාලනය සහ ගජමිතුරු කල්ලිය පරදවමු!

'ශ්‍රී ලංකා ක්‍රිකට් වැනසූ දූෂිත දේශපාලනය සහ ගජමිතුරු කල්ලිය පරදවමු! ක්‍රිකට් ඇතුළු ක්‍රීඩා පනත වහා සංශෝධනය කරනු!' යන මැයෙන් විරෝධතාවයක් පසුගිය නොවැම්බර් 15 වැනි දින ගාල්ල නගරයේදී පැවැත්විණි. සමාජවාදී තරුණ සංගමයේ අනුබද්ධ සංවිධානයක් වන SAVE THE SPORT සංවිධානය මගින් මෙය සංවිධානය කර තිබූ අතර මේ සඳහා තරුණ තරුණියෝ රැසක් සහභාගි වූහ.




# සයිප්‍රස් තරුණයින්ගෙන් ලංකාවට උපකරණ පරිත්‍යාගයක්


සයිප්‍රසයේ එඩෝන් (EDON) තරුණ සංගමය සහ සමාජවාදී තරුණ සංගමය ඒකාබද්ධව පාසැල් හා රෝහල් සඳහා උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පසුගිය නොවැම්බර් 08,09 හා 16 දිනවලදී දිස්ත්‍රික්ක කිහිපයක් මුල් කරගනිමින් සිදු කරන ලදී. නුවරඑළිය දිස්ත්‍රික්කයේ තලවාකැලේ, ලිඳුල ප්‍රදේශයේ පිහිටි වතු ආශ්‍රිත පාසල් දෙකක් වන ෆෙයර්ෆීල්ඩ් දෙමළ විද්‍යාලය, බෙල්ග්‍රේවියා දෙමළ විද්‍යාලය හා හම්බන්තොට දිස්ත්‍රික්කයේ පහළ මත්තල ප්‍රාථමික විද්‍යාලයන්හි සිසුන්ට පාසල් උපකරණද, පේරාදෙණිය සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහලට අවශ්‍ය සෞඛ්‍ය උපකරණද මෙලෙස පරිත්‍යාග කෙරිණි.

සයිප්‍රසයේ වාමාංශික තරුණ සංගමය වන 'එඩෝන්' සංවිධානයට අනුබද්ධ ළමා පුරෝගාමී සංවිධානය විසින් මෙහි මූල්‍යමය දායකත්වය සපයා තිබිණි. ඔවුන් ඒ සඳහා අරමුදල් සපයා ගෙන තිබුණේ පසුගිය නත්තල් සමයේ ඔවුන් විසින්ම නිර්මාණය කරන ලද විවිධ සමරු භාණ්ඩ, අත්කම් නිර්මාණ, ආහාර ද්‍රව්‍ය විකුණා සොයා ගත් මුදලින්ය. එම වැඩසටහන නම් කර තිබුණේ 'Solidarity Carol'නමිනි. ඔවුන් විසින් එය සෑම වර්ෂයකම සිදුකරනු ලබයි. පසුගිය වසරේදී ඔවුන්ගේ දායකත්වය ලබා දී තිබුණේ කොලොම්බියාවේ දරුවන් වෙනුවෙනි.

මේ මොහොතේ ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් කඩා වැටීමකට ලක්ව ඇති බැවින්, අධ්‍යාපන - සෞඛ්‍ය ක්ෂේත්‍රයන්හි දුෂ්කරතාවකට මුහුණ දී සිටින මෙරට දරුවන් වෙනුවෙන් මෙවර එම සහයෝගීතාව ලබා දීමට ඔවුන් තීරණය කළේ සමාජවාදී තරුණ සංගමය සමග අත්වැල් බැදගනිමිනි. ජාත්‍යන්තර සහයෝගිතාවය පිළිබඳ වටිනා අත්දැකීමක් වූ මෙම අවස්ථාවට සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා, සමාජවාදී තරුණ සංගමයේ ජාත්‍යන්තර කටයුතු ලේකම් අංජන අමරසිංහ සහෝදරයා, ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ ආසියා පැසිපික් කලාපයේ හිටපු සභාපතිනි මධූ කල්පනා සහෝදරිය ඇතුළු පිරිසක් එක්ව සිටියහ.




## පැසිෆික් සාගර පතුලේ හඳුනා නොගත් "රන් බිත්තරය"



ඇමරිකානු විද්‍යාඥයින් විසින් පසුගිය සැප්තැම්බර් 08 වන් දින ඇලස්කා ගැඹුරු මුහුදු පත්ලේ ගුප්ත ගෝලාකාර හැඩැති නිදර්ශකයක් සොයාගෙන ඇත. නමුත් එය කුමක්දැයි කිසිවෙකු නිශ්චිතව තවමත් හඳුනාගෙන නැත.



දුරස්ථව ක්‍රියාත්මක වන සමීක්ෂණ වාහනයක් භාවිතා කරන සාගර පර්යේෂකයෝ පසුගිය සතියේ ඇලස්කා බොක්කෙහි සැතපුම් දෙකක් පමණ ගැඹුරු පර්වතයක් මත මෙම අමුතු අයිතමය දුටු විට මවිතයට පත්වූහ.

මුලදී, සාගර පර්යේෂකයින් විසින් තවමත් හඳුනා නොගත් වස්තුව 'කහ තොප්පියක්' ලෙස හැඳින්වූ නමුත් දැන් එය 'රන් බිත්තර' හෝ 'ගෝල්ඩන් ඕබ්' ලෙස හැඳින්වේ.

සුදු පැහැති ස්පොන්ජියක් මැද්දේ, විෂ්කම්භය සෙන්ටිමීටර 10ට (අඟල් 4) මඳක් වැඩි මෙම සිනිඳු, රන්, ගෝලාකාර හැඩැති මෙම වස්තුව පර්වතයට තදින් ඇලී ඇති බව වාර්තා වේ.

## හඳේ පස්වල හයිඩ්‍රජන් අඩංගු බව සොයා ගැනේ




විද්‍යාඥයන් විසින් සඳ පාෂාණවල හයිඩ්‍රජන් අඩංගු වන බව සොයා ගෙන ඇති අතර, ගගනගාමීන්ට චන්ද්‍ර ජලය ලබා ගත හැකි බව යෝජනා කර තිබේ.

ඇපලෝ මෙහෙයුම් අතරතුර ගෙන ආ චන්ද්‍ර පාෂාණ පිළිබඳ නවතම විශ්ලේෂණයකින් පළමු වරට ඒවායේ හයිඩ්‍රජන් පවතින බව අනාවරණය කර ගෙන ඇත. මෙම සොයාගැනීමෙන් පෙනී යන්නේ අනාගත ගගනගාමීන්ට ජීව ආධාරක සහ රොකට් ඉන්ධන සඳහා සඳ මත ඇති ජලය කවදා හෝ භාවිතා කළ හැකි බවය.

NASA විසින් පර්යේෂණ අධ්‍යයනයක් සඳහා චන්ද්‍ර සාම්පල ලබා දුන් එක්සත් ජනපද නාවික පර්යේෂණ රසායනාගාරයේ (NRL) පර්යේෂකයන් පසුගිය සතියේ නිවේදනය කළේ ඔවුන් පරීක්ෂා කළ සඳ පස් සාම්පල 79,221හි හයිඩ්‍රජන් සොයා ගත් බවය.

## වියට්නාම් අලින්ට නව හැඳුනුම්පතක්




වියට්නාමයේ වන අලි නව සංරක්ෂණ සැලැස්ම තුළ සුවිශේෂී හැඳුනුම්පතක් නිකුත් කිරීමට තීරණය වී ඇත. දැනට ස්වභාවධර්ම සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමයේ රතු ලැයිස්තුවේ වඳවී යාමේ තර්ජනයට ලක්වී ඇති මෙම අලි විශේෂය ආරක්ෂා කිරීම සඳහා සුවිශේෂී ව්‍යාපෘතියක් වියට්නාමයේ රජය සහ සත්ව ආරක්ෂක සංගම් එක්ව ක්‍රියාත්මක කර තිබේ. එය රටේ ඉතිරිව ඇති වන අලි රංචු ආරක්ෂා කිරීම සඳහා වියට්නාමයේ නව ජාතික අලි සංරක්ෂණ ක්‍රියාකාරී සැලැස්මේ කොටසකි. කැමරා උගුල් භාවිතයෙන් එක් එක් සතා සඳහා තනි ඡායාරූප හැඳුනුම්පත් සහ පැතිකඩ නිර්මාණය කිරීම, අලි මිනිස් ගැටුම් නිරීක්ෂණය කිරීම සහ අලි ව්‍යාප්තිය පිළිබඳ සමීක්ෂණ පැවැත්වීම, අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා අලි ඇතුන්ගේ සංචරණයන් සහ හැසිරීම් වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වී ඇත.

# ලංකාවේ කිරි හරකාට
# පෞද්ගලීකරණයේ පෙරේත බැල්ම

ජනාධිපතිවරයාගේ මෑත (2023.07.31) ඉන්දියානු සංචාරයේදී එකඟතා ප්‍රකාශයක් හා අනතුරුව අමාත්‍ය මණ්ඩල තීරණයක්ද අනුව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා රජයට අයත් මිල්කෝ ආයතනය ඉන්දියාව ඒකාබද්ධ පුද්ගලික සමාගමකට පැවරීමට කටයුතු සිදුවෙමින් පවතී.

කිරි ගොවිපළ කර්මාන්තය සංවර්ධනය කිරීමේ අපේක්ෂාව හා ඉහත ආයතනයන්හි අකාර්යක්ෂමතාව වැනි හේතු පාඨ මගින් මෙම ආයතන ඉන්දියාවට පැවරීම සාධාරණීකරණය කරනු පෙනේ.

පැවරීමේදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ උපදේශ රැසක් ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් නිකුත් කර ඇත. තවදුරටත් ඉන්දියානු හා ශ්‍රී ලංකා රජයන් එක්ව දැක්වූ අභිප්‍රා ප්‍රකාශයක් ඉදිරිපත්ව ඇති අතර ඒ අනුව ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා මිල්කෝ ආයතනය පවරා ගැනීම සඳහා ඉන්දියානු ජාතික කිරි සංවර්ධන මණ්ඩලය, ගුජරාට් කිරි සමුපකාර අලෙවි සම්මේලන සමාගම හෙවත් අමුල් ආයතනය හා කාගිල්ස් ආයතනය එක්ව ඒකාබද්ධ ව්‍යාපාර සමාගමක් ස්ථාපිත කර ඇත.

පැවරීම ආශ්‍රිත කටයුතු සමස්ත වශයෙන් මෙහෙයවීම සඳහා ඉන්දියානු ජාතික කිරි නිෂ්පාදන සංවර්ධන මණ්ඩලයේ සභාපති හා ශ්‍රී ලංකා ජනාධිපති ජ්‍යේෂ්ඨ උපදේශකගේ ප්‍රධානත්වයෙන් ඒකාබද්ධව ක්‍රියාකාරී මණ්ඩලයක් කටයුතු කරමින් සිටී.

ඒ සමගමට පැවරීමට නියමිත ආයතනික චංචල හා නිශ්චල දේපළ තක්සේරු කිරීමේ කටයුතුද කඩිනමින් සිදු වෙමින් පවතී.

මෙම රාජ්‍ය ආයතන විකිණීමේ නිශ්චිත සැලැස්ම පිළිබඳ සමස්ත තොරතුරු රටේ ජනතාවට තබා ආයතනික කාර්යමණ්ඩලයටවත් අනාවරණය වී නොමැති අතර බොහෝ කටයුතු සිදුවන්නේ තිරය පිටුපසිනි.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට දිවයින පුරා පිහිටි සත්ව ගොවිපල් 32ක් අයත් අතර අයත් සමස්ත භූමි ප්‍රමාණය අක්කර 28,000කි. 1973 වසරේදී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය පිහිටුවීමේ පාදක අරමුණු පහත පරිදි විය.

- ඊට අයත් ගොවිපළ පද්ධතිය අභිජනන ගොවිපළ ලෙස ගෙන ඉහළ අභිජනිත පැටවුන් බෝ කර කර්මාන්තයේ නියැළී ගොවි ජනතාවට බෙදාදීම
- සත්ව නිෂ්පාදන ප්‍රවර්ධනය ආශ්‍රිත පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා උපයෝගී කර ගැනීම
- නවීන තාක්ෂණය හා මනා කළමනාකරණ න්‍යායන්හි ක්ෂේත්‍ර පරිහරණය ආශ්‍රිත අත්හදා බැලීම්
- පුහුණු වැඩමුළු ඇතුළු පශු සම්පත් සංවර්ධනයේ දැනුම් කේන්ද්‍රයක් ලෙස යොදා ගැනීම
- ගොවිපළේ ඉහළ ඵලදායී තත්වයක් පවත්වා ගනිමින් ගොවිපළ ආදර්ශන සැපයීම
- මස් කර්මාන්තය ප්‍රවර්ධනය
- ගොවිපළ කිරි ඇතුළු අනෙකුත් නිෂ්පාදන අලෙවිය මගින් මණ්ඩලයේ නඩත්තු කටයුතු සඳහා ඉපයීම

1986දී ජාතික කිරි මණ්ඩලය වෙනුවට මිල්කෝ ආයතනය රජයට අයත් සමාගමක් ලෙස ඇරඹී විවිධ ප්‍රතිව්‍යුහගතකරණයන්ගෙන් අනතුරුව 2002 පටන් රජයට අයත් පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කෙරිණි. මිල්කෝ ආයතනයේ සුවිශේෂී අරමුණ වන්නේද කිරි නිෂ්පාදකයන්ගේ කර්මාන්තයේ සුරක්ෂිතභාවයය. කිරි වෙළඳපොළ තිරසරභාවය, සාධාරණ මිල නියාමනය හා නිෂ්පාදන ගොවිපළ හිමියන්ගේ සුරක්ෂාවරණය විශේෂ කාර්යභාරයක් වෙයි.

සෞඛ්‍ය ආරක්ෂාව හා ගුණාත්මකභාවය සුරැකෙන සාධාරණ මිලකට අගය එකතු කළ කිරි නිෂ්පාදන පාරිභෝගිකයාට ලබා දීමත් අවසාන වශයෙන් සමස්ත කිරි නිෂ්පාදන වෙළඳපොළ දාමයේ ප්‍රධානියා ලෙස කළමනාකරණය හා නියාමනය පිළිබඳ වගකීමත් මිල්කෝ ආයතනයේ අපේක්ෂිත කාර්යභාරයන්ය.

මෙකී ආයතන පාලනයෙහිලා උපයෝගී වන පශු සම්පත් සංවර්ධන විෂය පිළිබඳ දැනුම නූතන තාක්ෂණ හා කළමනාකරණ ක්‍රමවේද, ආර්ථික විද්‍යානුකූල ප්‍රවේශයන් මෙන්ම සංවාදශීලී ප්‍රයෝගික දැක්ම සංයුක්තව ගෙන ආයතනික අරමුණු සාධනයෙහිලා ආයතන අධිකාරිත්වයෙන් සැලසුම් ක්‍රියාත්මක කළ යුතුව තිබුණි.

එහෙත් ඉකුත් දශක ගණනාව පුරා දේශපාලනික වරදාන ලෙස පත්වීම් ලද සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩල බොහෝ විට කටයුතු කර ඇත්තේ තම පුද්ගලික ලාභ ප්‍රයෝජන මෙන්ම පටු කණ්ඩායම්වාදී හා පක්ෂ දේශපාලන වුවමනාවන් වෙනුවෙනි.

සමස්තයක් වශයෙන් දූෂණය, වංචාව, අකාර්යක්ෂමතාව උඩුදුවන ලද රාජ්‍ය ව්‍යුහයක් තුළ මේවා පමණක් අපේක්ෂිත අරමුණු හඹායන ආයතන වූයේ නම් ඒ ආශ්චර්යයක් වන්නේය.

ඒ කෙසේ වෙතත් රටේ ඉතාම සාරවත් ඉඩම් සමූහයක පිහිටි ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩල ගොවිපළ පද්ධතිය විවිධ සංවාද විසංවාද මැද අභ්‍යන්තර කළමනාකාරිත්වයේ හා කාර්යමණ්ඩලයේ කැපවීම මත සීමිත ලාභයක් උපයමින් රජයේ පොදු අරමුදලින් නඩත්තු නොවන තත්වයක පවත්වාගෙන යමින් තිබේ.

මිල්කෝ ආයතනයද විවිධ දූෂණ හා අක්‍රමිකතා මැද පවා (කිරි කර්මාන්තයට මැදිහත් වීමෙන් ලද සුවිශේෂී අවකාශයට සාපේක්ෂව කොහෙත්ම ප්‍රමාණවත් නොවන නමුදු) සුවිශේෂ පාඩු නොලබන තත්වයක පවත්වාගෙන යන බවද වාර්ෂික වාර්තා අධ්‍යයනයේදී පෙනී යයි.

මෙවන් තත්වයක් තුළ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ හා මිල්කෝ ආයතනයේ පවතින ඌණ උපයෝගීතාව හා අකාර්යක්ෂමතාව අතිශයෝක්තියට ගෙන හදිසියේ රනිල් රාජපක්ෂ ආණ්ඩුව ඉන්දියාවට මෙම ආයතන පවරා දීමට තැත් කිරීම විමසිය යුතුය.

විධිමත් රාජ්‍ය පැවැත්මක් තුළ ඵලදායී ලෙස හසුරුවමින් ජාතික කිරි නිෂ්පාදනයේ කේන්ද්‍රිය මෙවලම් ලෙස යොදා ගත යුතු ආයතන මෙසේ ඉන්දීය සමාගම් වෙත පැවරීම අපට අනුමත කළ හැකිද?

ඉන්දීය ගුජරාට් කිරි නිෂ්පාදන සමුපකාර සමිතිය (අමුල් ආයතනය) ඇමරිකානු ඩොලර් බිලියන 07 ඉක්මවන වාර්ෂික පිරිවැටුමකට හිමිකම් කියන ආයතනයකි. දෛනික කිරි නිෂ්පාදන ධාරිතාව මිලියන 40 ඉක්මවයි. සමස්ත ඉන්දීය කිරි පරිභෝජනයෙන් 63%ක් සපයන්නේ අමුල් සමාගමය.

ඒ සමගම ලංකාවේ දිළිඳු කිරි ගොවිපළ හිමියන්ට සාපේක්ෂව ඊටද පහළ ජීවන තත්වයක් හිමි දිළිඳු ගොවීන්ද ඇතුළුව අමුල් සමාගමේ කිරි නිෂ්පාදන සාමාජිකයන් ගණන මිලියන 3.6 ඉක්මවයි. අමුල් කිරි සමුපකාර සමිතියෙන් අපද ඉගෙන ගත යුතු දෑ බොහෝය. එනමුදු සන්දර්භයන්ගේ යථාර්ථයන් පටළවා නොගත යුතුය.

අමුල් ආයතනයේ වගකීම එරට කිරි ගොවීන්මය. අමුල් ආයතනය තම කර්මාන්තය වර්ධනය කරගනිමින් තරගකාරී වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි ජාලය පුළුල් කරගැනීමට හා වැඩි ලාභ ලැබීමට වෙහෙසීමත් එමගින් තම සාමාජික (දිළිඳු) කිරි ගොවිපළ හිමියන්ගේ ලාභාංශ වැඩිකරගැනීමට වෙරදැරීමත් අතිශය සාධාරණය. අමුල් ආයතනයට තම දැවැන්ත කිරි නිෂ්පාදන සමුපකාරයේ අභිවෘද්ධිය පතා කළ යුතු දෑද බොහෝ තිබියෙදී හුදෙක් ලාංකේය කිරි නිෂ්පාදන කර්මාන්තයේ සුබසාධන වුවමනාවෙන් ලංකාවේ මිල්කෝ හා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අත්පත් කර ගැනීමට කටයුතු කරන්නේ යැයි සිහිබුද්ධියෙන් අනුමාන කළ හැකිද?

අනෙක් අතට තම ජාතික ආරක්ෂාව පිළිබඳ හැඟීම, බල වුවමනාව හා ආක්‍රමණකාරී පිළිවෙත මෙන්ම තම රටේ නිෂ්පාදන කර්මාන්ත පුළුල් කර විදේශීය සාරය ඇද ගැනීමේ දෘෂ්ටියෙන් බැලුවද මෙම ආයතන ඉන්දියාවට නතුවීම ඉන්දියානු රජයේ අභිලාෂයන් හා මනාව සමපාත වෙයි.

ඉන්දීය ඒකාබද්ධ සමාගම් මෙම ආයතන අත්පත් කර පවත්වාගෙන යාම (දැනට රාජ්‍යයන් හා ආයතන අතර හුවමාරු වන ලිපි මගින් තහවුරු වන්නේ, ශ්‍රී ලංකා රජය සමස්ත වශයෙන්ම මෙම ආයතන හිමිකමෙන් හා ඊට බලපෑම් කිරීමේ බලයෙන් බැහැර විය යුතු බවට අවධාරණය වන බවයි) තුළ අත්වන ප්‍රතිඵල ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයට කෙසේ බලපාන්නේ දැයි සලකා බැලිය යුතුය.

අමුල්-මිල්කෝ තනි සමාගමක් හවුල් කළමනාකරණයට ලක්වූ විට මතුවන ප්‍රවණතාවන් පුරෝකථනය කර ඇත්ද? පරිභෝජනයට අවශ්‍ය පමණින් 35%ක් නිපදවමින් සිටින අපේ රටේ ජනතාවට අවශ්‍ය ඉතිරි කිරි 65% අමුල්-හයිලන්ඩ් හවුල්කාර සමාගම මගින් අපට පෙවීමට ඉන්දියාව සැලසුම් නොකරාවිද?

JVC මගින් ජාතික පශු සම්පත් මණ්ඩල ගොවිපල් සශ්‍රීක කර ලාභ සහිතව පවත්වා ගැනීම මගින් අපට සැලසෙන අතිශය සමෘද්ධිමත් ප්‍රයෝජනය කුමක්ද? ලංකාවේ කිරි නිෂ්පාදන ප්‍රවර්ධනය උදෙසා අපේ දේපළ ඉන්දියාව ප්‍රමුඛ හවුල්කාර සමාගමකට පවරා දීම මගින් අප අපේක්ෂා කළේ මොනවාද? අපට ලැබෙන්නේ තාක්ෂණ හා කළමනාකරණ මග පෙන්වීමද? ආයෝජන සඳහා මූල්‍ය දායකත්වයේ මැදිහත්වීමද? නැතිනම් ගොවිපළ ශ්‍රමයද?

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හා මිල්කෝ ආයතන අපේක්ෂිත අරමුණ කරා මෙහෙය වී නොමැති අතර අසාර්ථක බවද පිළිගත යුතුය. ඊට ප්‍රධාන වශයෙන් හේතුව රටේ ඉහළම නායකත්වයේ සහ විටින් විට අයාලයේ පත්වන ආයතන අධිකාරිත්වයේ ආකල්ප හා බලපෑම් මෙන්ම සමස්ත රාජ්‍ය ව්‍යුහයටම අරක්ගත් දූෂණය, නාස්තිය හා අකාර්යක්ෂමතාවය බවද ඒ සමග සඳහන් කළ යුතුය.

කෙසේ වෙතත් කිරි කර්මාන්ත විෂයෙහි ආයතනික ව්‍යුහය, දේපළ හා ජාතික ප්‍රතිපත්ති සැලසුම් තුළ පවා මෙම ආයතන ස්ථානගත වී ඇති අයුරු සැලකීමේදී විශාල විභවයක් හා ඵල ලැබීම් ධාරිතාවන්ද සහිතය. සරල ප්‍රතිව්‍යුහගත කිරීම් හා යම් පමණක රාජ්‍ය හා පුද්ගල ඒකාබද්ධ මැදිහත්වීමක් යටතේ මෙම ආයතන විධිමත් කළමනාකාරිත්වයට ආදේශ විය යුතුය. සදාචාර හා යහපත් රාජ්‍ය පාලනයක් තුළ යම් දිනෙක ජාතික කිරි ගොවිපළ කර්මාන්තය ආශ්‍රිත මර්මස්ථානයන් විය යුත්තේද මෙම ආයතනයන්මය.

හුදු කප්පම් දීමක් ලෙස හෝ විකිණීමට හෝ නිසි සාධනීය දැක්වීමකින් තොරව මෙන්ම මෙම වටිනා සම්පත් අපේ අයිතියෙන් බැහැර කිරීමේ ආදීනව නොසලකා ඉන්දියානු ප්‍රමුඛ සමාගම් වෙත පවරා දීමට කටයුතු කිරීමට එරෙහිව පශු සම්පත් කර්මාන්තයේ පාර්ශ්වකරුවන් ඇතුළු සමස්ත ජනතාවම පෙළගැසිය යුතු බවට අප යෝජනා කරන්නේ එබැවිනි.



> තම ජාතික ආරක්ෂාව පිළිබඳ හැඟීම, බල වුවමනාව හා ආක්‍රමණකාරී පිළිවෙත මෙන්ම තම රටේ නිෂ්පාදන කර්මාන්ත පුළුල් කර විදේශීය සාරය ඇද ගැනීමේ දෘෂ්ටියෙන් බැලුවද මෙම ආයතන ඉන්දියාවට නතුවීම ඉන්දියානු රජයේ අභිලාෂයන් හා මනාව සමපාත වෙයි.

# ලෝක දේශපාලනයට බලපෑම් කරන ඊශ්‍රායල - පලස්තීන යුද්ධය



ඔක්තෝබර් හත් වන දින උත්සන්න වූ ඊශ්‍රායල - පලස්තීන යුද්ධයේ හතළිස් හත්වැනි දිනයේදී ඊශ්‍රායලය හා පලස්තීන හමාස් සංවිධානය අතර දින හතරක සටන් විරාමයක් ඇති කර ගන්නා ලදී. කටාර් රාජ්‍යයේ මැදිහත්වීමෙන් ඇතිකර ගන්නා ලද සටන් විරාමය දින හතරකට පසුව තව දින දෙකකින් දීර්ඝ කරනු ලැබීය.

මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කරන ලද ගිවිසුමේ මූලික කොන්දේසි වුයේ;

● පලස්තීන හමාස් සිරකරුවන් 150 දෙනෙකු වෙනුවෙන් හමාස් භාරයේ සිටින ඊශ්‍රායල් ප්‍රාණඇපකරුවන් පනස් දෙනකු හුවමාරු කරගැනීම, (මේ අතරින් වැඩි දෙනෙක් වයස අවුරුදු 19 ට අඩු ළමුන් සහ කාන්තාවන්ය) ● ඊශ්‍රායලය ගාසා තීරයේ සියලු ප්‍රදේශවලට මානුෂික ආධාර බෙදා හැරීම සඳහා ඉඩකඩ ලබාදීම, (දිනකට ට්‍රක්රථ තුන්සීයක් බැගින්) ● සටන් විරාමය පවතින අතරතුර ඊශ්‍රාලය දකුණු ගාසා තීරය තුළ කෙරෙන සියලු පහරදීම් නවතා දැමීම සහ උතුරු ප්‍රදේශ හරහා ගුවන් ගමන් උදෑසන 10 සිට සවස 04 දක්වා පැය හයක කාලයක් අත්හිටුවා තැබීම, ● සටන් විරාම කාලය තුළදී ඊශ්‍රායලය පලස්තීනුවන් අත්අඩංගුවට ගැනීම නවතා උතුරේ සිට දකුණ දක්වා ජනතාවට මහා මාර්ග හරහා ගමන් කිරීමට ඉඩ ලබා දීම ආදියයි.

ඊශ්‍රායල් අත්අඩංගුවේ පලස්තීන සිරකරුවන් 7000ක් පමණ සිටිතැයි ගණන් බලා තිබේ. හමාස් සංවිධානය ඊශ්‍රායල ප්‍රාණ ඇපකරුවන් දෙසිය තිස් නව දෙනකු රඳවා තබාගෙන සිටිතැයි ඊශ්‍රායල් පවසයි. පසුගිය කාලයේදී හමාස් සංවිධානය ප්‍රාණ ඇපකරුවන් ලෙස තබා ගත් හතරදෙනකු නිදහස් කරනු ලැබ තිබේ.

ඊශ්‍රායලය හා හමාස් සංවිධානය අතර සටන් විරාමයක් ඇති කර ගැනීම සඳහා කටාර් රාජ්‍යය මෙන්ම ඊජිප්තුවද මැදිහත් වූ අතර හමාස් සංවිධානය හා ඊශ්‍රායලය අතර ප්‍රාණඇපකරුවන් හුවමාරුවේ දී තමන්ට වාසිදායක කොන්දේසි යටතේ සිදු කිරීමට මැදිහත් වීම පිළිබඳ ඊශ්‍රායලය ඇමරිකා එක්සත් ජනපද ජනාධිපති ජෝ බයිඩන්ට සිය ස්තූතිය ප්‍රකාශ කර තිබේ.

### සටන් විරාමයක් සඳහා බල කෙරුණු හැටි

ඊශ්‍රායලය මේ ආකාරයේ සටන් විරාමයකට එකඟ වන්නේ ජාත්‍යන්තර වශයෙන් පමණක් නොව ඊශ්‍රාලය තුළින්ද මතු වූ විරෝධය හේතුවෙනි. ලොව පුරා රටවල් ගණනාවක්ම ඊශ්‍රායලයේ මෙම මානව සංහාරයට ප්‍රබල විරෝධයක් එල්ල කළ අතර ඇතැම් රටවල් තම තානාපතිවරුන් ආපසු කැඳවන ලදී. රටවල් පහක් ඊශ්‍රායල ජනාධිපති බෙන්ජමින් නෙතන්යාහුට එරෙහිව ජාත්‍යන්තර අධිකරණය හමුවටද ගොස් තිබේ.

නොවැම්බර් 22 දින වන විට පලස්තීනයේ ගාසා තීරය තුළ සිදු වූ ඝාතන සංඛ්‍යාව 14,128ක් පමණ වූ අතර ඉන් 5890ක්ම ළමුන්ය; 3920ක් කාන්තාවන්ය.

මේ අතර ඇමෙරිකා එක්සත් ජනපදයෙහි වෝල් ස්ට්‍රීට් ජර්නල් පුවත්පත වාර්තා කර තිබුණේ ලෙබනනය තුළ ස්ථානගත වී සිටින, ඉරාන ආධාර ලබන හිස්බුල්ලා සංවිධානයෙන් ප්‍රහාරයක් එල්ල වීමේ අවදානම හේතුවෙන් ඊශ්‍රායලය ලෙබනන් දේශසීමාව ආසන්නයේ ලක්ෂයක පමණ හමුදාවක් කැඳවීමට කටයුතු කර ඇති බවයි. මේ අතර ඉරාකයේ ඉස්ලාමීය ප්‍රතිරෝධී හමුදා ඉරාකය තුළ හා සිරියාව තුළ ඇති එක්සත් ජනපද හමුදා කඳවුරු වෙතද ප්‍රහාර එල්ල කිරීම ආරම්භ කර තිබේ. මෙම තත්වයද ඊශ්‍රායලය සටන් විරාම ගිවිසුම වෙත එළඹීමට අවශ්‍ය තත්වයන් සකසන්නට ඇති බව විචාරකයින්ගේ අදහසයි.

### ලෝක දේශපාලනයේ නව වර්ධනයක්?

කෙසේ වෙතත් මෙම සටන් විරාමය ඊශ්‍රායල - පලස්තීන යුද්ධයේ අවසානය නොවනු ඇත. එහෙත් මෙවර ආරම්භ වූ පලස්තීන ඊශ්‍රායල් යුද්ධය ලෝක දේශපාලන ප්‍රතිවිරෝධතා තවදුරටත් තීව්‍ර කරමින් තිබේ. විශේෂයෙන්ම මෙම යුද්ධය ඇමරිකා එක්සත් ජනපදයේ ලෝක ආධිපත්‍යය තවදුරටත් දුර්වල කරනු ලැබ ඇත. එක්සත් ජනපදය මෙහි දී ගත් ස්ථාවරය විසින් එක්සත් ජනපදය හා ලෝකයේ සෙසු රටවල් අතර ඇති පරතරය තවදුරටත් වැඩි කිරීමට ඉවහල් වී තිබේ.

මෙම යුද්ධය එක්සත් ජනපදයේ දෙබිඩි පිළිවෙත වඩාත් හොඳින් නිරාවරණය කළේය. එක්සත් ජනපදය ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් සුරැකීමේ ප්‍රමුඛයා ලෙස පෙනී සිටිමින් චීනය, ඉරානය, හා කියුබාව වැනි රටවල් මානව හිමිකම් කඩ කරන රටවල් ලෙස හංවඩු ගසමින් ඔවුන් මත සම්බාධක පනවමින් ක්‍රියා කළ අයුරු කාටත් මතකය. එහෙත් ඊශ්‍රායලය විසින් ගාසා තීරයේ මහා මිනිස් සංහාරයක් සිදු කරද්දී ඇමරිකා එක්සත් ජනපදය, ඊශ්‍රායලය විවේචනය නොකළා පමණක් නොව එකී සංහාරය සඳහා අවශ්‍ය නවීන ආයුධ, ගුවන් යානා සහ බෝම්බද ඊශ්‍රායලය වෙත ලබා දීමට ද කටයුතු කළේය.

එපමණක් නොව, එක්සත් ජනපද පාලකයන් අතර සහ එරට පොදු මහජනතාව අතර ගැටුමද මෙමගින් තීව්‍ර කරනු ලැබ තිබේ. විශේෂෙන් ඇමරිකා එක්සත් ජනපදයේ බුද්ධිමතුන්, උගතුන් හා මධ්‍යම පාන්තිකයෝ තම ජාතික වුවමනාවන්ට අදාළ නොවන ප්‍රශ්න සඳහා රටේ ජාතික ධනය නොසැලකිලිමත් ලෙස (ඊශ්‍රායල - පලස්තීන යුද්ධය සඳහා) වියදම් කිරීම පිළිබඳ සිය විරෝධය පළ කරමින් සිටිති.

එසේම, මෙම යුද්ධය ඇමරිකා එක්සත් ජනපද පාලනය හා අරාබි ලෝකය අතර ප්‍රතිවිරෝධතාද උග්‍ර කරමින් තිබේ. එකී තත්වයේ වර්ධනය පිළිබඳ අදහස් දක්වන බොහෝ විචාරකයන් පවසන්නේ මෙම යුද්ධය විසින් ලෝක දේශපාලනයේ අලුත් තත්වයක් ඇති කරනු ඇති බවය.

## ඔක්ස්ෆෑම් සේවකයන් වර්ජනයක




Oxfam පුණ්‍යායතනයේ සේවකයෝ දෙසැම්බර් මාසය තුළදී දින දාහතක වැඩවර්ජනයක යෙදීමට තීරණය කර සිටිති. වැඩවර්ජනය කිරීමට පක්ෂව එම ආයතනයේ සේවකයින්ගෙන් 83%ක් කැමැත්ත ප්‍රකාශ කර තිබේ. මේ අනුව දෙසැම්බර් 8 - 31 දිනවලදී මෙම වැඩවර්ජනය දියත් කිරීමට නියමිතය. ඔක්ස්ෆෑම් ආයතනයේ වසර 81ක ඉතිහාසය තුළ මේ ආකාරයට වැඩ වර්ජනයක් සිදු කෙරෙන ප්‍රථම වතාවයි.

එහි සේවක වෘත්තීය සමිති ප්‍රකාශ කරන ආකාරයට 2018 වසරේ සිට ආයතනයේ මූර්ත වැටුප් සියයට 21කින් කප්පාදු කර දමා තිබෙන අතර සියයට 06ක වැටුප් වැඩි වීමක් සහ අවම වැටුප්ලාභීන්ට පවුම් දාහක බද්දෙන් නිදහස් වැටුප් වැඩිවීමක් ඉල්ලා සිටියද පරිපාලනය ඒ පිළිබඳ සාකච්ඡා මඟහරිමින් සිටී.

Oxfam ආයතනය තමන්වම හඳුන්වා ගනු ලබන්නේ 'දරිද්‍රතාවය නමැති අසාධාරණය අවසන් කිරීමට සහයෝගයෙන් ක්‍රියා කරන මිනිසුන්ගේ ජාත්‍යන්තර ව්‍යාපාරයක්' ලෙසය. Oxfam යනු බ්‍රිතාන්‍ය පුණ්‍යායතන විසි එකක් එකතු වී ගොඩනඟාගත් සම්මේලනයකි. එම ආයතනයේ මුදල් සංචිතය 2022 වසරේදී පවුම් මිලියන 44.6ක් විය.

## ලෝකය: ජයටම සිදුවන අවි වෙළඳාම




ස්ටොක්හෝම් ජාත්‍යන්තර සාම පර්යේෂණ ආයතනයට අනුව 2022 වසරේදී ලෝකයේ ආරක්ෂක අයවැය එක්සත් ජනපද ඩොලර් ට්‍රිලියන 2.2ක් දක්වා වැඩිවී තිබේ. මේ ලෝකයේ ආරක්ෂක වියදම් අඛණ්ඩව ඉහළ යන අටවන වර්ෂයයි.

2018-2022 දක්වා ලෝකයේ විශාලතම ආයුධ අපනයනකරු වී ඇත්තේ ඇමෙරිකා එක්සත් ජනපදයයි. ලෝකයේ අවි වෙළඳාමෙන් 40%ක් ඇමරිකා එක්සත් ජනපදය විසින් සිදුකරනු ලබයි. දෙවන විශාලතම අවි අලෙවිකරුවා වන්නේ රුසියාව වන අතර එය ලෝකේ මුළු අවි වෙළඳාමෙන් 16%කි. තෙවැනි රට ප්‍රංශයේ වන අතර ප්‍රංශය සමස්ත ලෝක ආයුධ වෙළඳාමෙන් 11% ක් සිදු කරයි.


ඇමරිකා එක්සත් ජනපදය විසින් අලෙවිකරන අවිවලින් 20%ක් සෞදි අරාබිය වෙත ලබා දෙන අතර 8.6%ක් ජපානය වෙතද 8.4%ක් ඕස්ට්‍රේලියාව වෙතද අලෙවි කරනු ලබයි.

## එක්සත් ජනපදය: ජනතා සිහින බිඳදමමින්



'American Dream' හෙවත් 'ඇමරිකානු සිහිනය' ලෙස හැඳින්වෙන්නේ, තමන්ගේ පසුබිම කුමක් වුවත් ඇමරිකා එක්සත් ජනපදය තුළ වෙහෙස මහන්සි වී වැඩ කරන කවරෙකුට වුවද සාර්ථකත්වය අත්පත් කරගත හැකිය, යන අදහසටයි. ඇමරිකා එක්සත් ජනපදයේ වෝල් ස්ට්‍රීට් ජර්නල් සඟරාව මෑතකදී කරන ලද සමීක්ෂණයකට අනුව ඇමරිකානු සිහිනය ළඟා කරගත හැකි යයි විශ්වාස කරන්නේ එරට ජනතාවගෙන් සියයට 36 පමණක් බව හෙළි වී තිබේ. එක්සත් ජනපද ජනතාවගෙන් 18%ක් විශ්වාස කරන්නේ ඇමරිකානු සිහිනය කිසිදිනක ළඟා කරගත හැකි නොහැක්කක් බවයි. එම සමීක්ෂණය අනුව එක්සත් ජනපද ජනගහනයෙන් 50%ක් එරට ආර්ථික හා දේශපාලන ක්‍රමය ජනතාවට එරෙහි ක්‍රමයක් යැයි විශ්වාස කරන අතර මීට අවුරුදු පනහකට පෙර තත්වයට සාපේක්ෂව එරට ජීවත් වීම වඩා දුෂ්කර වී ඇතැයි පවසා ඇත.

## ප්‍රංශය: සුභසාධන කප්පාදු කරමින්




පසුගිය නොවැම්බර් 14 වන දින ප්‍රංශ සෙනෙට් සභාව කප්පාදු ක්‍රියාමාර්ග කිහිපයකට අනුමැතිය ලබා දී තිබේ. ඉන් එක් පියවරක් වන්නේ ලියාපදිංචි නොවූ සංක්‍රමණිකයන්හට සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමේ අයිතිය තහවුරු කරනු ලැබූ රාජ්‍ය වෛද්‍ය උපකාරක වැඩසටහන නවතා දැමීමයි. මේ පිළිබඳව ප්‍රකාශයක් නිකුත් කළ ප්‍රංශ වෛද්‍යවරුන් ප්‍රකාශ කර සිටින්නේ එය තමන්ගේ වෘත්තීය ගරුත්වයට නොගැළපෙන බවත් තමන් ලබාදුන් දිවුරුමට එකඟ නොවන බවත් ඒ නිසා දිගටම ලියාපදිංචි නොවූ සංක්‍රමණිකයන් හට වෛද්‍ය ආවරණය ලබා දීමට කටයුතු කරන බවත්ය.

සෙනෙට් සභාව මගින් සම්මත කරගනු ලැබූ අනෙකුත් ක්‍රියාමාර්ග මගින් ලියාපදිංචි නොවූ සංක්‍රමණිකයන්ට පොදු සමාජ සේවාවන් ලබා ගැනීමට ඇති අයිතියත් ඔවුන්ගේ ආරක්ෂාවත් සීමා කරනු ලැබ තිබේ. එමගින් විශේෂයෙන් ළමුන්ගේ අවශ්‍යතා සහ අයිතීන් කප්පාදු කරන බවද වාර්තා වේ.

# රනිල්ට එරෙහිව රනිල්ගේ අයවැය R vs R

පාර්ලිමේන්තුවේ 34වැනි අයවැයද පසුගියදා අපූරුවට විරෝධය පාමින් ආණ්ඩුවේ බහුතරයෙන් සම්මත කරන ලදී. අයවැය හා සමාජ මාධ්‍ය පළ කළ සිත්ගන්නා සුළු සරල අදහස වූයේ "ඔවුන්ගේ වැය අපෙන් අය කරන හැටි කියන ලියවිල්ල" ලෙසටයි. උන්ගේ වැය ජනතාවගෙන් අය කරන්නේ අයවැය මගින් පමණක්ම නොවේ. අයවැය නැති කාලයේත් මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන කෙටි පණිවුඩ මගින් ඒ කටයුත්තම සිදුකරයි.

මෙවර අයවැය මගින් බොහෝ දෙනා අපේක්ෂා කළේ කරටත් උඩින් ගොස් ඇති වැඩිවන ජීවන වියදමට උත්තරයකි. ලබන වසරේ ඡන්ද පැවැත්වීමේ වුවමනාවට ජනතාව රැවටීම සඳහා ඉදිරිපත් කරන "පොරොන්දු යෝජනා" වත් ඇතැයි බොහෝ දෙනා විශ්වාස කළෝය. වැඩකරන ජනතාව ඉහළ යන ජීවන වියදම් දර්ශකය පදනම් කරගෙන රුපියල් 20,000ක වැටුප් හෝ දීමනාවක් ඉල්ලා සිටියහ. නමුත්, ඒ ඉල්ලීමත් අයවැයේ බාලගිරි දෝෂයට ලක්විය. පොදුවේ ගත් කළ මෙවර ඉදිරිපත් කර ඇත්තේ මෑත කාලයේ ආණ්ඩුවක් විසින් ඉදිරිපත් කරන ලද දුර්වලම අයවැයකි. නමුත්, ඒ දුර්වල අයවැය ඉදිරිපත් කරන ආර්ථික සංදර්ශනය ලංකා ඉතිහාසයේ ආර්ථිකයක් අර්බුදයට පත් දුෂ්කරම කාලය බව ඉතාම පැහැදිලිය. මෙවර අයවැයේ මූලික ලක්ෂණ කිහිපයකින් පොදු දුර්වලතා මෙන්ම ධනේශ්වර ආණ්ඩුකරණයේ සම්පූර්ණ අසාර්ථකත්වය හඳුනා ගත හැකිය. ඒ අතරින් හඳුනාගත හැකි මූලික ලක්ෂණ කිහිපයකි.

## අසම්පූර්ණ අයවැයක්!

අයවැයක් මූලික ලෙසම වියදම් ඇස්තමේන්තු හා එම වියදම පියවා ගන්නා ආදායම් මාර්ගයන්ගෙන් සංයුක්ත විය යුතුය. නමුත් මෙවර අයවැය වියදම් කරන හැටි කියා ඇතත් එම වියදම පියවා ගන්නා ආදායම් මාර්ග පෙන්වා නැත. එක්කෝ ආණ්ඩුව චාරිත්‍රානුකූල අයවැයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත්තේම ඒ මත ඉදිරි වසරේ කටයුතු නොකරන හිතුවක්කාර තීරණ ගන්නා බවට පූර්ව අදහසක් තුළ සිටිමින්ය. උදාහරණ ලෙස අයවැය කථාවේ රජයේ සේවකයින්ගේ සහ විශ්‍රාමිකයන්ගේ වැටුප් වැඩි කිරීමට ඇති යෝජනාව වෙනුවෙන් වෙන්කර ඇත්තේ රුපියල් බිලියන 133කි. නමුත් 13 ලක්ෂයක් වන රාජ්‍ය සේවකයින්ට රුපියල් 10,000 බැගින් මාස 12කට වැටුප් හා දීමනා වැඩිකරන්නේ නම්, රුපියල් මිලියන 156ක් (13×12×10,000) අවශ්‍යය. විශ්‍රාමිකයින් 730,000ද 2500 බැගින් ඇතුළත් වූ වට තවත් මිලියන 16ක් සහිතව මුළු වෙන්කිරීම් අවශ්‍යතාවය රුපියල් මිලියන 172කි.

මීට පෙර අයවැයේ සඳහන් කර ආදායම අවශ්‍යතාවය සඳහා ආණ්ඩුව ගනු ලබන ක්‍රියාමාර්ග අයවැය කථාව සමග පාර්ලිමේන්තුවේ ඇමුණුම ලෙස ඉදිරිපත් කරන තාක්ෂණික සටහන් මගින් විස්තරාත්මකව දක්වනු ලැබේ. නමුත් මෙවර ආණ්ඩුව V සහ VI ලෙස දක්වා ඇත්තේ තවත් කථා දෙකකි.

උදාහරණ ලෙස බදු ගෙවන්නන් හඳුනා ගැනිමේ අංකයක් යොදා ගැනීම මගින්, ඕනෑම බැංකුවක ජංගම ගිණුමක් විවෘත කිරීමේදී ගොඩනැගිලි සැලැස්මක් සඳහා අනුමැතිය ඉල්ලා සිටින විටෙක, මෝටර් රථයක් ලියාපදිංචි කරන හෝ බලපත්‍රය අලුත් කරන අවස්ථාවක ඉඩමක් හෝ ඉඩමක හිමිකම ලියාපදිංචි කරන විටකදී මෙම බදු අංකය හඳුන්වා දෙන බව දක්වා ඇතත් ඒ මගින් අපේක්ෂිත රුපියල් බිලියන 3820ක බදු ආදායමෙන් කවර ප්‍රමාණයක් සම්පූර්ණ කර ගන්නේදැයි දක්වා නොමැත.



## පරණ වයින් අලුතින් පිරවීම

අයවැයට ඇතුළත් බොහෝ යොජනා අලුත් යෝජනා ලෙස පෙනුණද ඒවා සාම්ප්‍රදායිකව හැම අයවැයකම ඇතුළත් කළ, එහෙත් ක්‍රියාත්මක නොකළ යෝජනාය. හිඟුරක්ගොඩ ගුවන්තොටුපළද එවැන්නකි. සෑම අයවැයකම පලාලි ගුවන් තොටුපළ, රත්මලාන පර්යන්තය, මත්තල පුළුල් කිරීම ඇතුළත් කෙරිණි. එයට වෙන්කර ඇත්තේ මිලියන 2000කි. හරිත ආර්ථිකය, ආහාර සුරක්ෂිතතාවය, තරුණ අභිවෘද්ධි වැඩසටහන්, සැමට ඉංග්‍රීසි, ශ්‍රී ලංකා ජාතික සන්නාමය වැනි නම් තුළින් යොදා ඇත්තේ ක්‍රියාත්මක කරන යෝජනා නොවන මුදල් වෙන්කර, පසුව වෙනත් "අත්‍යාවශ්‍ය වියදම් සේ" සලකා මුදල් වැය ශීර්ෂ මාරු කරනු ලබන යෝජනාය.

මීට අමතරව මෙම අයවැය මගින් ඉලක්ක කරන ආදායම් ඉලක්ක බොහෝමයක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එළඹි විස්තීර්ණ ණය පහසුකම් සඳහා අත්සන් කළ ලියවිල්ලේ මීට වසරකට කලින්ම අඩංගු කර ඇත. එම වාර්තාවේ 41 පිටුව හා අයවැය මනා ලෙස ගැලපේ. ඔවුන් (IMF) මීට වසරකට පෙර බදු ආදායම් ලෙස 2024 දී ලබා ගැනීමට අපේක්ෂා කරන ඉලක්කය හදා දුන්නේ රුපියල් බිලියන 1080කි. අයවැයේ අපේක්ෂිත අගය 1010කි. මුළු ආදායම IMF අනුව 4107කි. අයවැයට අනුව 4463කි. මුළු වියදම බිලියන 6594කි. අයවැය කථාව අනුව බිලියන 6978කි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව සමස්ත අයවැය හිඟය බිලියන 2132කි. අයවැයට අනුව 2401කි. ඉලක්කමින් පමණක් නොව යෝජනා අනුවද අයවැය සකස් කර ඇත්තේ වසරකට පෙර මූල්‍ය අරමුදල සමග ඇති කරගත් එකඟතාව අනුවය.

## අතාත්වික - අතාර්කික අයවැය

මේ අයවැය සැලසුමක් නැති අයවැයකි. මේ මොහොතේ රට හමුවේ ඇති ප්‍රධාන අභියෝගය විදේශ විනිමය අර්බුදයයි. නමුත් මේ අයවැය ඒ පිළිබඳව වචන මාත්‍රයක් හෝ අඩංගු නැති අයවැයකි. මූල්‍ය අරමුදලේ එකඟතාවයන් අනුව මේ අයවැය අදාළ වන 2024 වසරේ විදේශ ආයෝජන ඩොලර් මිලියන 2495ක් ලංකාවට ගෙන ආ යුතුය. නමුත් ඒ ගැන අදහසක් හෝ මේ අයවැයේ නොමැත. අයවැය යනු වැය මෙන්ම අය කරන ක්‍රමවේදය සහිත විය යුතුය. නමුත් මෙම අයවැයේ 'අය', අය කරන ක්‍රමයක් සඳහන් නැත.

## රනිල් vs රනිල්

රනිල්, රනිල්ට එරෙහිව ඉදිරිපත් කරන ලද අයවැයක් බව ඔහුගේ කථාවේ බොහෝ තැන්වලින් පැහැදිලිව පෙන්නුම් කෙරේ. ඔහුට අනුව බෞද්ධ ආර්ථික දර්ශනය නොතකා හැරීමේ ප්‍රතිඵල ලෙස නිදහසින් වසර 75ක් ගත වන විට, රට අන්ත අසරණ බංකොලොත් රාජ්‍යයක් බවට පත්ව ඇත. ඒ බංකොලොත් බවට ඇද දැමූ ආර්ථික ප්‍රතිසංස්කරණ ගෙන ආ විවෘත ආර්ථිකයේ නිර්මාතෘවරුන් ඔවුන්මය. රනිල්ට අනුව, ඔහු බාරගෙන ඇත්තේ, මරණාසන්න ලෙඩෙකි. අපායක් බවට පත්වුණු රටකි. පීලි පැන හතරගාතේ ඇදවැටී තිබූ රටකි. ඔහුගේ පාපෝච්චාරණය ඉතා නිවැරදිය. නමුත් ඒ තත්වයට ඇද වැට්ටවූ රටේ ඔහු 1977 සිටම පාර්ලිමේන්තුව සහ කැබිනට් මණ්ඩලයේ ඉතා වගකීම් සහිත ඇමතිකම් දැරූවෙකි. රටේ පස් වතාවක් අගමැති බව ඔහුට අමතකය.

අයවැය කථාවේ තවත් තැනක රනිල් වික්‍රමසිංහ සඳහන් කරන්නේ "ආදායම් වැඩි කරන්නේ නැතුවත් ඕනෑ නම් පඩි වැඩි කරන්න පුළුවන්. ඒ කොහොමද? සල්ලි අච්චු ගහන්න ඕනෑ. නැතිනම් පිටරටකින් ණය ගන්න ඕනෑ. ඒත් නැතිනම් අලුතින් බදු ගහන්න ඕනෑ. ඒ පිළිවෙත සමජීවිකතා සංකල්පයට විරුද්ධයි. එවැනි පියවරවලින් වෙන්නේ රට නැවතත් අගාධයකට ඇද වැටීමයි" නමුත් අයවැයේ ඔහු යෝජනා කර ඇත්තේ ඔහුට එරෙහි යෝජනාමය. නැවතත් සෑම පුද්ගලයෙකුගෙන්ම බදු අය කිරීමට ඔහු යෝජනා කරයි. අයවැයට පිටින් ජනවාරි සිටම වැට් බදු 18% ක් වැඩිකර ඇත්තේද ඔහුමය. එයද සමජීවිකාවට පටහැණිය. මේ අයවැය මගින් ආණ්ඩුවේ ණය සීමාව රුපියල් බිලියන 3000කින්ම ඉහළ දමා ඇත්තේ මුදල් අච්චු ගැසීමට ඉඩ ලබාගැනීමටය. 2024 වසරට විදේශවලින් ණය ලබා ගැනීමටය. අපේක්ෂිත ණය ප්‍රමාණය රුපියල් බිලියන 1000ක් ලෙස දක්වා ඇත. එය 2022 හා 2023 දී පැවතියේ 780ක් ලෙසයි. රනිල් අයවැය කථාවෙන් කියන කරුණුවලට පරස්පර යෝජනාම අයවැය යෝජනා මගින් ඉදිරිපත් කරයි. අයවැය ඇස්තමේන්තුවල අමාත්‍යාංශ සඳහා වෙන් කිරීමද සමජීවී බෙදීමට සපුරා පරස්පර වේ. මුළු අමාත්‍යාංශ 27කටම වෙන්කර ඇත්තේ වියදම්වලින් 21%ක් වන විට ජනාධිපතිගේ වැය ශීර්ෂයට සහ ඔහුගේ අමාත්‍යාංශ 07කට පමණක් මුළු වියදම්වලින් 67% ක් වෙන්කරගෙන ඇත.

## අයවැය හා මූල්‍ය කළමනාකරණය

අයවැය කථාවෙන් ඉදිරිපත් කරන දේ ඊළඟ වසරේ ක්‍රියාවට නැගුණේද යන්න විමසා බලන්නේ අයවැය සමගම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මූල්‍ය කළමනාකරණ වාර්තාව මගිනි. 2023 වසරේ සැප්තැම්බර් දක්වා සත්‍ය ලෙස ආර්ථිකයේ කටයුතු ක්‍රියාත්මක වී ඇති ආකාරය පිළිබඳව වාර්තාවක්ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් විය. එයට අනුව සැසඳීමේදී (සටහන 1) රජයේ මුළු ආදායමෙන් 82%ක්ම මේ දක්වා දරා ඇත්තේ පොලී ගෙවීමටය. 2022ට වඩා 2023දී පොලී ගෙවීමට වැඩි වී ඇති ප්‍රමාණය රුපියල් බිලියන 809කි.

පාරිභෝජනය මත බදු පැනවීම 2022 (ජනවාරි - සැප්තැම්බර්) බිලියන 405ක් වන විට 2023දී 690කි. වැඩිවීම 70%කි. උපයන විට ගෙවීම මත බදු 2022දී අය කරගෙන ඇත්තේ බිලියන 17කි. එය 2023දී (ජනවාරි - සැප්තැම්බර්) බිලියන 107කි. වැඩිවීමේ ප්‍රතිශතය 497%කි. පොලී ආදායම මත බදු අයකිරීමද 2022 දී බිලියන 14කි. 2023දී එම අගය බිලියන 110කි. වැඩිවීම වේගය 672%කි. මේ කරුණු අනාවරණය වන්නේ අයවැය මගින් නොව රටේ සංවාදයකට ලක් නොකරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාව අනුවය.

## වැයට අය කිරීම

ආණ්ඩුවට වැය කිරීම සඳහා ජනතාවගෙන් අය කරන අයවැයක් මිස ජනතාවට වැය කිරීමට යොදවා ගන්නා අයවැයක් රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නැත. අයවැය සම්මත කිරීමේදී නරක බිරිඳ දික්කසාද නොකර දීග කෑමේ න්‍යාය පොහොට්ටුවේ රාජපක්ෂ පිල අනුගමනය කරමින් ඡන්දය දී අයවැය සම්මත කළේය.

දීග කෑමේ වුවමනාවෙන් පාර්ලිමේන්තුවේ සම්මත කළත්, ජන මනසේ රනිල් පරාදය. දැන් ජනතාවගේ ඡන්ද බලයෙන් මහජන බලයෙන් දීග කන නරක කසාද සියල්ල ජනතාවම, දික්කසාද කළ යුතුය. මන්ද එසේ නොවුණහොත් නරක දීගවලට නඩත්තු ගෙවීමට සිදුවන්නේ සුපුරුදු පරිදි ජනතාවටමය. ජනතාව විසින් පාලකයින් නඩත්තු කරන අවසාන අයවැය බවට මේ අයවැය පත්කළ හැක්කේද මහජනතාවටම පමණි.

> අයවැයක් මූලික ලෙසම වියදම් ඇස්තමේන්තු හා එම වියදම පියවා ගන්නා ආදායම් මාර්ගයන්ගෙන් සංයුක්ත විය යුතුය. නමුත් මෙවර අයවැය වියදම් කරන හැටි කියා ඇතත් එම වියදම පියවා ගන්නා ආදායම් මාර්ග පෙන්වා නැත. එක්කෝ ආණ්ඩුව චාරිත්‍රානුකූල අයවැයක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත්තේම ඒ මත ඉදිරි වසරේ කටයුතු නොකරන හිතුවක්කාර තීරණ ගන්නා බවට පූර්ව අදහසක් තුළ සිටිමින්ය.



"තමන්ගේ සියලු වැරදි සහ ශක්තීන් සහිත මනුෂ්‍යයෝ සමාජ ව්‍යාපාරයක යාන්ත්‍රණය සංයුක්ත කරති. ඔවුන් වැරදි කළ යුතුය. එසේම වැරදිවලින් පාඩම් උගත යුතුය. වඩ වඩාත් වැරදි කළ යුතුය. එම වැරදිවලින් අලුතින් උගත යුතුය. ඔවුන් ජයග්‍රහණය මෙන්ම පරාජයද රස බලා, ඒ එක් එක් අවස්ථාව සමග ජීවත් වන්නේ කෙසේදැයි සොයා ගත යුතුය. කාලය සහ ක්‍රියාව ගුරුවරුන්ය."

**මාටින් ලූතර් කිං**

# උරුමයෙන් මිදීම

ප්‍රසුගාමී ධනවාදී ආර්ථික ක්‍රමයක් ඇති අප වැනි රටක ස්ත්‍රීන්ට හිමි වන්නේ දෙවැනි ස්ථානයයි. සමාජ ආර්ථික කොන්දේසිවල බලපෑම උග්‍ර වන විට එයින් වඩාත් පීඩාවට පත්වන්නේ ස්ත්‍රියයි. වර්තමානය තුළ මේ තත්වය වඩාත් ඔඩු දුවමින් සෑම අතින්ම ස්ත්‍රීන් මත පීඩනය උපරිම වී ඇත. සදාකාලිකවම එම පීඩනය උරුමයක් සේ පවත්වා ගන්නවාද නැතහොත් එයින් මිදෙනවාද යන්න තීරණය කිරීමේ අවසන් කඩ ඉමට අප ළගා වී තිබේ. එයින් මිදෙන්නේ කෙසේද? පොදුවේ ලාංකේය සමාජය ලෙස වැටී ඇති අගාධයෙන් ගොඩ ඒමට දැනට පෙනෙන විසඳුම සේ ඇත්තේ මැතිවරණ ක්‍රියාවලියක් හරහා දූෂිත කල්ලියේ පාලනය පෙරළා දමා ජනතාවාදී පාලනයක් බිහි කිරීමයි. එය කළ යුතුව ඇත්තේ අපට හිමිව ඇති ඡන්දයේ බලයෙනි. එහෙත් ස්ත්‍රීන් ලෙස අපට හිමිව ඇති ඡන්ද අයිතිය ලබා ගෙන ඇත්තේ බන්දේසියක තබා නොව අරගල ක්‍රියාවලියක් තුලිනි.

සර්ව ජන ඡන්ද අයිතිය ලබාගත් පළමු බ්‍රිතාන්‍ය යටත්විජිතය වූයේ ශ්‍රී ලංකාවයි. නමුත් එක්දහස් නවසිය විසි ගණන් වන විටත් ස්ත්‍රීන් ඡන්ද බලය අහිමි වූවන් ලෙස සිට ඇති අතර ඒ අනුව එක්දහස් නවසිය විසි ගණන් සිටම ස්ත්‍රීන්ගේ ඡන්ද අයිතිය ලබා ගැනීමේ උද්ඝෝෂණ ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ ඇති විය. ජෝර්ජ් ඊ. ද සිල්වාගේ බිරිඳ ඇග්නස් සිල්වා, නෙලී ගුණසේකර, ඩේසි ඩයස් බණ්ඩාරනායක, වෛද්‍ය මේරි රත්නම්, ඊ.ආර්. තම්බිමුත්තු මහත්මිය, වෛද්‍ය නල්ලම්මා, සත්‍යවාගීස්වර අයියර්, ඩී.එම්. ගුණසේකර මහත්මිය වැනි තවත් අය ඒ සඳහා පුරෝගාමී වූහ. සෑම ජන කොටසකටම අයත් ස්ත්‍රීන් එකමුතු වී තම ඡන්ද අයිතිය ලබා ගැනීම වෙනුවෙන් සටන් කිරීම විශේෂත්වයක් විය.

කෙසේ වෙතත් මේ ස්ත්‍රී ඡන්ද බල ව්‍යාපාරය දැඩි ලෙස විවේචනය කළ පිරිසක් ද මෙරට සිටි බව අමතක නොකළ යුතු කරුණකි. ව්‍යවස්ථාදායක සභාව ඇතුළත හා ඉන් පිටතත් සිංහල, දෙමළ, ඉංග්‍රීසි ජන මාධ්‍යයන් තුළත් ස්ත්‍රීන්ගේ ඡන්ද අයිතිය ඉල්ලා කරන මේ සටන දැඩි ලෙස විවේචනයට ලක්වූ බව සඳහන්ය. ඒ සෑම අවස්ථාවකදීම ස්ත්‍රීන් යනු වරප්‍රසාද නොලැබිය යුතු කොටසක් බවත් ඔවුන් සිටිය යුත්තේ සැමියාගේ, දරුවන්ගේ, තම ගෙදර දොරේ කටයුතු කරගෙන සුවච, කීකරු බිරින්දෑවරුන් ලෙස මිස සටන් කොට යමක් දිනා ගත යුතු මට්ටමේ නොවන බව ඔවුන්ගේ අදහස විය. එවැනි අරගලයක නිරත ස්ත්‍රීන් සංකර, හැදියාවක් නැති පිරිසක් ලෙස සමාජයේ තහවුරු කිරීමට ඔවුහු කටයුතු කළහ.

1927 දෙසැම්බර් 06 සිංහල ජාතිය පුවත්පතේ පළ වූ අදහස වූයේ "කුමන රටේ සිටියත් ස්ත්‍රීන්ගේ වගකීම වන්නේ දේශපාලනයට සම්බන්ධ වීම නොව යහපත් දරුවන් හදා වඩා ගැනීම බවයි"

එසේම සිංහල ජාතිය පුවත් පත 1929 පෙබරවාරි 5 වැනි දින "දේශපාලනය සහ ශ්‍රමය යනු පිරිමින්ට පමණක් අදාළ වන ප්‍රශ්න බවත් ලෝකය පුරා දක්නටය ලැබෙන කාර්යයක් වන්නේ එවැනි දෑවලට සම්බන්ධ වීමට උත්සහ කරන කැරලිකාර ස්ත්‍රීන් තුළින් පුරුෂ ගතිගුණ පෙන්වන බවත්ය"

රටක් හෝ ජාතියක් හෝ ගොඩනැගීම හෝ විනාශ කිරීම යන දෙකෙන් එකක් කළ හැකි එකම කණ්ඩායම ස්ත්‍රීන් බව සාමාන්‍ය දැනුමයි.

(1927 අප්‍රේල් 13, සිංහල ජාතිය පුවත්පත)

1928 සැප්තැම්බර් 9 ස්වරාජ්‍ය පුවත්පත "සමහර ධනේශ්වර කාන්තාවෝ වට්ටි අම්මලා, කුස්සි අම්මලා සහ දුප්පත් ස්ත්‍රීන්ට ඡන්දය ලැබිය යුතුය යන කාරණය ගැන සතුටු නැත" යනුවෙන් සඳහන් කරයි.

1925 ජුනි 20 searclight සඟරාව සඳහන් කරන්නේ "ලංකාවේ අපිට බයිස්කෝප් කෙල්ලන් සමග සටන් කිරීමට සිදුව තිබේ. තමන්ට දියණියක හෝ සහෝදරියක් සිටීමට වාසනාවන්ත වූ පාඨකයන්ට මා කියන්නේ බයිස්කෝප් කෙල්ලන්ගෙන් පරිස්සම් වෙන ලෙසයි. ගැහැනු දරුවා තමන්ගේ දෙමාපියන්ගේ හෝ සහෝදරයා හෝ සැමියා යනාදී භාරකරුවන්ගේ අතින් මිදුණු විට ළමා කාලයේ සිට ඇයට හුරු පුරුදු කර ඇති කුඩාම ලැජ්ජාව සහ බිය පවා විපරීතව විනාශ වන තරමට ඇය වගකීමෙන් තොර පූර්ණ සංකරභාවයට පත් වේ. මා මෙය දකින්නේ ජාතියේ ශ්‍රේෂ්ඨත්වයට මාරාන්තික හානියක් ලෙසය. ඇය නිවසේ ජීවගුණය මරා දමයි. ඇය සාමයේ හුස්ම හිර කරයි. ඇය විනීතකම සීමාවේ ප්‍රමාණය පිළිබඳ හැඟීම විනාශ කර සදාචාර විරෝධී සියලු වර්ගයන් එකට ගෙනැවිත් සමාජය කුණු තුවාලයක් බවට පත් කරයි" යනුවෙනි.

මෙලෙස බොහෝ පාර්ශ්ව ස්ත්‍රීන්ගේ ඡන්ද සටනට විරුද්ධව මත පළ කරද්දී එයට පක්ෂව අදහස් ඉදිරිපත් කළ අයද නොසිටියා නොවේ.

උතුරු පළාතේ ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික එස්. රාජරත්නම් පැවසුවේ "අපි ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට වහලුන් හා අර්ධ වහලුන් ලෙස සැලකිය යුත්තේ ඇයි? ඔවුන්ට ඡන්ද බලය දීමට අප බැඳී සිටිනවා යැයි අප දැන සිටිය යුතු සේම ඔවුන් ඡන්දය යුක්ති සහගත ලෙස භාවිතා කරනු ඇති බව අප දැන ගත යුතුයි" (Hansard volu iii 1928 1928:1722)

"පුරුෂයන් විසින් ස්ත්‍රීන් කුස්සියට සීමා නොකළ යුතු අතර, තමන් විසින් නිදහස දිනා ගැනීමට ස්ත්‍රීන් උත්සාහ කළ යුතුය" යනුවෙන් සමගි බලය පුවත්පතේ 1923 පෙබරවාරි 05 වෙනි දින සඳහන් කරයි.

මෙවැනි දහසක් බාධක කම්කටොලු මැද අවසානයේ දී ඔවුන් ජයග්‍රහණය කළහ. ඒ අනුව 1931 දී ලංකාවට සර්වජන ඡන්ද බලය හිමි විය.

ඡන්ද අයිතිය ලැබූ කාන්තාවෝ එදා මෙදා තුර තම ඡන්දය බොහෝ වාර ගණනක් පාවිච්චි කර ඇත. අපමණ බාධක කම්කටොලු මැද ලබාගත් ඡන්ද අයිතිය ඔවුන් මෙතෙක් නිවැරදිව පාවිච්චි කළා දැයි අපට ඇත්තේ සැකයකි. එසේ නම් කාන්තාවන්ට ඉතිහාසයේ දැඩි පරිශ්‍රමයකින් ලබාගත් ඡන්ද අයිතියේ වටිනාකම අවබෝධ කර දිය යුතු වේ. ඊට හේතුව වන්නේ මෙතෙක් කලක් රජුන් තනන්නට ලංකාවේ ජනගහනයෙන් හරි අඩකට වඩා වැඩි කාන්තාවෝ තම ඡන්ද අයිතිය පාවිච්චි කළ බැවිනි. නමුත් අපි මෙතෙක් කලක් නිවැරදිව රජුන් තැනුණේ දැයි නැවත නැවතත් සිතා බැලිය යුතු වේ.



2023 වසර ගෙවී ගොස් නැවුම් බලාපොරොත්තු මුසු අධිෂ්ඨානශීලී නව වසරක අබිමුව අපි හිඳින්නෙමු. ඒ බලාපොරොත්තුව වසර ගෙවී යන්නේ ශ්‍රී ලාංකීය භූමිය තුළ අලුත් පාලනයක සලකුණු සනිටුහන් කරන මැතිවරණයන් සමග වනු ඇත. එළැඹෙන වසරේ පවත්වන මැතිවරණයන් තීරණාත්මක වන්නා හා සේම එහි ජයග්‍රහණයන් අත්පත් කර ගැනීම වෙනුවෙන් රටේ ජනගහනයෙන් හරි අඩකට වඩා වැඩි කාන්තා ඡන්ද දායිකාවන් බලමුළු ගැන්වීම කළ යුතුමය. එහිදී තමන්ගේ ඡන්දයේ වටිනාකම කොතෙක්ද එම ඡන්දය කෙතරම් බලවත් දැයි ඡන්ද දායිකාවන්ට අවබෝධ කරවීම වඩා වැදගත් වෙයි.

එළැඹෙන වසර නව පාලනයක් සහිත වසරක් බවට පත් කරගත හැකිවනුයේ සර්වජන ඡන්ද බලය ලැබීමෙන් පසු ලංකාවේ බහුතරයක් කාන්තාවන්ගේ ඡන්ද අයිතිය තම ස්වාමිපුරුෂයාගේ වුවමනාව වෙනුවෙන් හෝ බඩු මල්ලකට, රැකියාවකට, දරුවා පාසලට දමා ගැනීමට වැනි පෞද්ගලික කාරණාවන්ට යට කළ බහුතරයක් කාන්තාවන් සැබැවින්ම එය එසේ නොවිය යුතු බව වටහා ගැනීමෙන් පමණකි.



## වෙනස්කම් නිර්මාණයටත් එයට නායකත්වය දීමටත් පෙළගැසෙමු!

**ආචාර්ය හරිනි අමරසූරිය**
**පාර්ලිමේන්තු මන්ත්‍රීනි**
**ජාතික ජන බලවේගය**


මේ රටේ ගැහැනු ඡන්දදායකයින් හැටියට පාවිච්චි වී තිබුණට ගැහැනුන් හැටියට අපේ අවශ්‍යතාවයන් සහ අපේ ජීවිතවල අපි මුහුණ දෙන ගැටලුවලට විසඳුම් ලබා ගැනීම සඳහා අපිත් දායක කරගන්න, අපිටත් හඬක් නඟන්න හැකියාව තිබෙන ආණ්ඩුවක් නිර්මාණය කරන්න අපි මැදිහත් වෙලා නැහැ. අපි ඡන්දදායකයින් විතරක් නොවෙයි. අපි මේ රටේ පැති ගණනාවකින් තීරණාත්මක පුරවැසියන්. ජනගහනය පැත්තෙන් බැලුවත් අපි තමයි බහුතරය. ඒ වගේම මේ රටේ ආර්ථිකයටත් සමාජ ක්‍රියාවලියටත් විශාල කාර්යභාරයක් කරන ජන කෙටසක්. අපි වැටුප් ලබාගෙන කරනු ලබන ආර්ථික දායකත්වයටත් එහා ගිය වැටුප් නොලබා අපෙන් විශාල සමාජ කාර්යභාරයක් ඉටුවෙනවා.

අපිට දැන් කාලය පැමිණ තිබෙනවා. දැන් සමාජය වේගයෙන් වෙනස් වෙනවා. එළඹෙන අවුරුද්දේ විශාල දේශපාලන පරිවර්තනයක් සිදුවීමට නියමිතයි. ඒ පරිවර්තනය තුළ ගැහැනු අපිත් කොටස්කරුවන් විය යුතුයි. කොටස්කරුවන් පමණක් නොවෙයි සිදුවෙන පරිවර්තනය අපිට අවශ්‍ය විදිහට පෙළගස්වා ගන්නටත්, අපිටත් සාධාරණත්වයක් හා වටිනාකමක් එන සමාජයක් ගොඩනැගීම සඳහා විය යුතු වෙනස්කම් කර ගැනීම සඳහාත් අපි තීරණාත්මක ලෙස මැදිහත් විය යුතුයි. තවදුරටත් අපිව ඡන්දදායකයින් හැටියට පාවිච්චි වෙනවා වෙනුවට, මේ රටේ පුරවැසියන් හැටියට සිදුවෙන වෙනස්කම නිර්මාණය කිරීමටත් ඒකට නායකත්වය දෙන්නත් අපි ඉදිරිපත් විය යුතුයි.

## බංග්ලාදේශයේ ඇඟලුම් කම්හල් විරෝධතා!


ලෝකයේ ප්‍රසිද්ධ සන්නාම යටතේ ඇඟළුම් නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලා 3500 කට අධික ප්‍රමාණයක් බංග්ලාදේශයේ පවතින අතර ඒවායේ සේවය කරන කම්කරු ප්‍රජාව අතරින් බොහෝමයක් අයහපත් වැඩ තත්ත්වයන් සහ ජීවන තත්ත්වයන් යටතේ ජීවත් වෙති. එසේම ස්ත්‍රී පුරුෂ කම්කරුවන් අතර වැටුප් අසමානතාද බොහෝමයක් පවතී. කෙසේ නමුත් වැටුප් වර්ධනයක් ඉල්ලා බංග්ලාදේශ සේවකයින් උද්ඝෝෂණවල නිරත වූහ. එරට ආණ්ඩුව වැටුප් මණ්ඩලයක් මගින් යම් වැටුප් වර්ධකයක් යෝජනා කරන ලද නමුත් එය සේවකයින් ඉල්ලා සිටින වැටුප් වර්ධකයට වඩා අඩකට අඩු ප්‍රමාණයකි. ඒ හමුවේ නැවත වර්ධනය වූ උද්ඝෝෂණ වලදී පොලිස් ජීව උණ්ඩ ප්‍රහාරයකින් ඇඟළුම් සේවිකාවක්ද ඝාතනයට ලක්විය. පොලිසිය සහ සේවක සේවිකාවන් අතර මෙම උද්ඝෝෂණ අතරදී බොහෝ ගැටීම් ඇතිවී තිබේ.

## අවතැන් කොංගෝ කාන්තාවන්ට හිරිහැර!



පසුගිය වසර පුරා නැගෙනහිර කොංගෝවේ කාන්තාවන් සහ දැරිවියන් සිය දහස් ගණනක් ඔවුන්ගේ නිවාසවලින් බලහත්කාරයෙන් පිටමන් කොට අවතැන් වී සිටී. ගෝමා ප්‍රදේශයට ආසන්න අවතැන් වූවන්ගේ කඳවුරුවල සිටින පිරිස් වලින් සියයට 60 ක් පමණ මෙම කාන්තාවන්ගෙන් සමන්විත වෙයි. පසුගිය ජුලි මාසය තුළ මෙම කඳවුරු තුනක් ආශ්‍රිතව ලිංගික හිංසනයට ලක්වූ කාන්තාවන් 1500 කට ප්‍රතිකාර සිදුකර ඇති බවට වාර්තා වී ඇත. එය මැයි මාසයේ වාර්තා වූ සිදුවීම් ප්‍රමාණයට වඩා දෙගුණයකට වැඩි ප්‍රමාණයක් බව කියවේ.

## ඉරානයේ සාදයකදී 300ක් අත්අඩංගුවට!




පසුගිය සමය පුරාම මාසා අමීනි තරුණියගේ මරණයද පදනම් කරගනිමින් එරට සදාචාර පොලිසිය අහෝසි කරන ලෙස බලකරමින්ද අන්තගාමී සමාජ නියාමයන්ද හෙළා දකිමින් විරෝධතා රැල්ලක් වර්ධනය විය. කෙසේ නමුත් එකී විරෝධතා තවමත් පවතින අතර එරට කාන්තාවන් සහ පිරිමි එකට එක්ව පැවැත්වූ ප්‍රිය සම්භාෂණයක් හේතුවෙන් 300 ක් පමණ අත්අඩංගුවට ගෙන ඇත. තවද එවැනි මිශ්‍ර සාදයක් පැවැත්වූ ශිෂ්‍ය පිරිසකගේ ශිෂ්‍යභාවය අහෝසි කිරීමට එරට වෛද්‍ය අධ්‍යාපන විශ්වවිද්‍යාලය කටයුතු කර ඇත. විද්‍යාවද යටපත් කරමින් තවමත් මෙම රටවල්වල පවත්වාගෙන යන ආගමික අන්තවාදී සමාජ නියාමයන් සම්බන්ධයෙන් මෙම සිදුවීම් නිදසුන් සපයයි.

# 'නරුම' චින්තනයේ තරම

ප්‍රසුගිය දිනෙක නුවරඑළියේ දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමට සහභාගි වූ ජනාධිපති රනිල් වික්‍රමසිංහ එහි නිලධාරීන්ට තර්ජනය කරමින්, අනතුරු අඟවමින් නුවරඑළියේ සංකේතයක් වූ තැපැල් කාර්යාලයේ ගොඩනැගිල්ල වහාම නිදහස් කරදෙන ලෙස බල කළේය. ඒ, එම ගොඩනැගිල්ල සංචාරක හෝටලයක් සඳහා තාජ් සමුද්‍රා හෝටලයට ලබාදීම සඳහාය.

ජනාධිපතිවරයා රාජ්‍ය පරිපාලන ක්‍රමවේද නොසලකා, නිලධාරීන්ට බලය පෙන්වීම විධායක ජනාධිපති ධුරයේ අනුහසින් කරන්නක් නිසා ඒ පිළිබඳව වෙනම සාකච්ඡා කළ යුතුය. එය පසෙක තැබුවද නුවරඑළියේ තැපැල් කාර්යාලය එහි ඇති ඓතිහාසික වටිනාකම නොසලකා 'මිල' කිරීමට තීරණය කිරීම මගින් පෙන්වන්නේ ජනාධිපතිවරයාගේත් ආණ්ඩුවේත් ඔවුන් විසින් පවත්වාගෙන යනු ලබන ආර්ථික ප්‍රතිපත්තියේත් 'නරුම' ස්වභාවය වේ.

## නරුමයා යනු කවුද?

නරුමයා යනු කවුද යන ප්‍රශ්නයට කෙටි පිළිතුරක් දෙන බටහිර චින්තකයෙක් වූ ඔස්කා වයිල්ඩ් වරක් පවසා තිබුණේ "නරුමයා යනු හැම දෙයකම මිල දන්නා, එහෙත් වටිනාකම නොදන්නා පුද්ගලයා" ලෙසය. ජනාධිපතිවරයාගේ සිට රට පාලනය කරන හැම දෙනාගේම චින්තනය 'නරුම' එකකි. ඔවුන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය තුළද මෙම නරුමකම ගැබ්ව තිබේ. ආර්ථික ක්‍රමය (නව ලිබරල්වාදය) නිසා පාලකයන් නරුම වූවාද, නැතිනම් පාලකයන්ගේ නරුමකම නිසා ආර්ථිකය නරුම වූවාද යන්න විවාද සම්පන්න වුවත් අපේ රටේ ආර්ථිකයත් පාලකයාත් දෙකම 'නරුම' වී තිබේ.

සැබෑ ලෙසම ගත් විට පුද්ගලයන් 'නරුම' තත්වයට පත්කරනු ලබන්නේ අපේ රටේ පවත්වාගෙන යනු ලබන නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමය මගිනි. මෙම ආර්ථික ක්‍රමය පදනම්ව ඇත්තේ ලාභය වෙනුවෙන් නිපදවීම හා වෙළඳාම් කිරීමත්, අසීමිත ලෙස ලාභ ලැබීමේ තෘෂ්ණාවත්, ඒ තුළ මුදල් ඉපයීම හා දේපළ රැස්කිරීම උමතුවක් බවට පත්කිරීමත් ඒ සඳහා සෑම දෙයක්ම මිල කිරීමට එනම් විකිණීමට බලකරනු ලැබීමත් මතය. එවිට හැම දෙයකම වටිනාකම් අහෝසි වී 'මිල' පමණක් ඉතිරි වේ.



"ඔබ සාධාරණ නිසා ලෝකය ඔබට සාධාරණ වනු ඇතැයි සිතන්නේනම් ඔබ ඔබවම මෝඩයෙක් කර ගනී. එය හරියටම ඔබ සිංහයන් නොකන නිසා සිංහයන් ඔබව නොකනු ඇතැයි බලාපොරොත්තු වීම වැනිය."

**චානක්‍ය (කෞටිල්‍ය)**

## සියල්ල විකිණිය හැකිද?

මෙම චින්තනයට හා ආර්ථික රටාවට අනුව අධ්‍යාපනය හා සෞඛ්‍යය යනු තවදුරටත් මහජන සේවාවන් නොව ලාබ ලැබිය යුතු ව්‍යාපාරයන් වේ. එවිට අධ්‍යාපනය



දැනුමක සිට වෙළඳ භාණ්ඩයක් බවට පත්වේ. සෞඛ්‍ය සේවය තුළ රෝගියා පාරිභෝගියෙක් වී සෞඛ්‍ය සේවාව වෙළඳාමක් වේ.

කලාව, ක්‍රීඩාව වැනි ක්ෂේත්‍රද එසේය. ඒවායේ සියලු ගුණයන්, වටිනාකම්, හරයන් සුණු විසුණු කර ඒවා ප්‍රාග්ධන හිමියන් අත, ජාවාරම්කරුවන් අත හැසිරෙන මුදල් ඉපයීම එකම අරමුණ කරගත් දේවල් බවට පත්වේ. එවැනි චින්තනයක් තුළ තැපැල් කන්තෝරු ගැන කථා කිරීම ඵල රහිතය.

මිනිසුන් අතර, සහයෝගය, සාමූහිකත්වය වර්ධනය කළ යුතු නිරෝගී පරපුරක් ගොඩනැගීමට ඉවහල් වන පුද්ගල පෞරුෂය ඇතිකරන, ජය පරාජය විඳ ගැනීමට ඇති හැකියාව වර්ධනය කරන මානව සම්බන්ධතාවයන් හා විනෝදාස්වාදයටද අවශ්‍ය දෙයක් වන ක්‍රීඩාව එම සියලු වටිනාකම්වලින් ගලවා වාණිජකරණය කර ඇති ආකාරයෙන්ද මෙය පැහැදිලි වේ.

## ක්‍රීඩකයන් වහලුන් කිරීම

ඉහත තත්වය හොඳින්ම දැකිය හැකි ක්‍රීඩාව වන්නේ ක්‍රිකට් ක්‍රීඩාවය. එය ආරම්භ වූයේ එංගලන්තයෙනි. ඒ, ධනවාදයේ යෞවන අවදියේ ඉහළ පංතියේ මහත්වරුන්ගේ ක්‍රීඩාවක් ලෙසය. ක්‍රිකට් ක්‍රීඩාව ඉහළ පංතියට සීමා නොවී පොදු ජනයා අතරට ඒම හොඳ දෙයක් බව ඇත්තය. එහෙත් අවසානයේ එම ක්‍රීඩාවේ ඇති සියලු ගුණයන්, සාම්ප්‍රදායන් හා වටිනාකම් මරා දමමින් ප්‍රාග්ධනය හිමි ජාවාරම්කරුවන්ගේ ගොදුරක් බවට පත්වෙමින් තිබේ. තරග පාවාදීම, තරගාවලි සඳහා ක්‍රීඩකයන් 'වෙන්දේසි කිරීම' දක්වාම මෙය පැමිණ තිබේ.

මීට හොඳම උදාහරණය ඉන්දියාවේ අයි.පී.එල්. තරගාවලිය වේ. එක් එක් ක්‍රීඩා සමාජවල අයිතිය තිබෙන්නේ ප්‍රසිද්ධ නළුවන්ද ඇතුළු විශාල ප්‍රාග්ධන හිමියන් අතය. ඔවුන් තරගාවලියෙන් තරගාවලියට ක්‍රීඩකයන් තම තමන්ගේ ක්‍රීඩා සමාජ සඳහා 'මිලදී ගනු' ලැබේ. එය සිදුවන්නේ ක්‍රීඩකයන් ප්‍රසිද්ධියේ වෙන්දේසි කිරීමක් සමගය.

එය රෝමයේ වහල් යුගය සිහිකරයි. එහිදී වහලුන් විවෘත වෙළඳපොලේ විකුණා දමන ලදී. රෝම වහල් වෙළඳාමත්, ක්‍රීඩකයන් වෙන්දේසියත් අතර ඇති වෙනස වන්නේ වහල් වෙළඳාමේදී වහලාට කිසිවෙක් නොලැබෙන අතර වහලුන් රැගෙන ආ පුද්ගලයාට මුදල් ලැබීමය. ක්‍රිකට් වෙන්දේසියේදී ක්‍රීඩකයා තමන්වම විකුණා ගන්නා අතර, මුදල් ලැබෙන්නේ ඔහුටය. එහෙත් මේ ආකාර දෙකේදීම අවසානයේ මිලදී ගන්නා මුදල් උපයන්නෙක්, ලාභ ලබන්නෙක් බවට පත්වේ. මේ නරුම සමාජ ක්‍රමය සමාජයට උරුම කර ඇත්තේ එවැනි තත්වයකි.

> සැබෑ ලෙසම ගත් විට පුද්ගලයන් 'නරුම' තත්වයට පත්කරනු ලබන්නේ අපේ රටේ පවත්වාගෙන යනු ලබන නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමය මගිනි. මෙම ආර්ථික ක්‍රමය පදනම්ව ඇත්තේ ලාභය වෙනුවෙන් නිපදවීම හා වෙළඳාම් කිරීමත්, අසීමිත ලෙස ලාභ ලැබීමේ තෘෂ්ණාවත්, ඒ තුළ මුදල් ඉපයීම හා දේපළ රැස්කිරීම උමතුවක් බවට පත්කිරීමත් ඒ සඳහා සෑම දෙයක්ම මිල කිරීමට එනම් විකිණීමට බලකරනු ලැබීමත් මතය.

## ශුද්ධ වූ සියල්ල කෙළෙසීම

මෙම ධනවාදී නිෂ්පාදන ක්‍රමයේ ජානමය ලක්ෂණයකි. 1848 දි මාක්ස්-එංගල්ස් ලියූ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනයේදී මේ පිළිබඳව ඔවුන් පැවසුවේ ධනවාදය තුළ ශුද්ධ වූ සියල්ල කෙළෙසෙන බවය. වෛද්‍යවරයාද, පූජකයාද, කවියාද, නීතිවේදියාද, විද්‍යා කටයුතුවල නියැලෙන්නාද ආදී සමාජ ගරුත්වයක් ලබා සිටි සියල්ලෝම වැටුප් ලබන ශ්‍රමියන් බවට පත්කරන බවය. එයට ක්‍රීඩකයාද අයිති වේ. දැන් ඔවුන් වැටුප් ලබන ශ්‍රමිකයන් බවට පත් කිරීමෙන් නොනැවතී ජාවාරම්කරුවන්ගේ, ප්‍රාග්ධන හිමියන්ගේ 'වහලුන්' බවටද පත්කරමින් තිබේ. එසේම ලංකාවේ දේශපාලනය තුළ පවත්නා, පවුල්වාද, කල්ලි, ජාවාරම්, නාස්තිය, අයථා ගනුදෙනු ආදී සියල්ලම ක්‍රීඩාවටද පැමිණ තිබේ. කලාවද ඉන් මිදී නැත.

තත්වය මෙලෙස වූ විට 'නරුම' කමේ 'කරුමය' ගෙවීමට සිදුවන්නේ, ජනතාවටය; රටකටය. 'කරුමය' යන වචනය මෙහිදී යොදා ගන්නේ විඥානවාදී ආගමික සංකල්පයක අර්ථයෙන් නොව ජන විඥානයට සුපුරුදු 'විපතක' අර්ථයෙනි. කෙසේ වෙතත් මිනිසුන් ගෞරව කරන සියලු දේ, මිනිසුන් ආදරය කරන දේ, ඓතිහාසික වටිනාකම් සහිතව ආරක්ෂා කර ගත යුතු දේ සියල්ල එක් අතකින් කෙළෙසෙන අතර අනික් අතින් මිල කෙරෙමින් තිබේ.

මෙහිදී බිඳ වැටෙන්නේ මානව සබඳතාය. රටකට ජනතාවකට අහිමි වන්නේ ඉතිහාසයක් තුළ මිනිසා ගොඩනැගූ පොදු වටිනාකම්ය. එසේම කෙළෙසීමට ලක්වන්නේ මානව ගරුත්වයය. බිඳවැටෙන්නේ අනාගත බලාපොරොත්තුය. අවසානයේ මෙම තත්වය නරුමකම වැළඳගැනීමට සියල්ලන්ටම බලකරයි. අප ඉදිරිපිට ඇති ඛේදවාචකය එයයි. එවිට මෙම නරුමත්වයේ 'කරුමය' ගෙවීමට සිදුවන්නේද ජනතාවටමය.

මේ තත්වයන් විසින් අවසානයේ එක දෙයක් කරනු ලැබේ. ඒ, මිනිසාට තමන් මුහුණපා ඇති ඛේදජනක තත්වය දෙස සංසුන් සිතින් බලා එය වටහා ගැනීමට බලකිරීමය. සමාජය යළි මුල සිට නිවැරදිව සකස් කිරීමට මෙම තත්වය මිනිසුන්ට බලකරන්නේය. දැන් අප ගෙවා දමමින් සිටින්නේ එවැනි අවදියකි; එවැනි කාලයකි.

# පොලිටිකල් පංතිය

පොලිටික්ක දවසක් පංතියට එනකොට ෆෝන් එකක් ගෙනල්ල ලාච්චුවට දාගෙන. ළමයි දන්නෙත් නෑ. සැරෙන් සැරේ මේසෙ ලාච්චුවට ඔළුව නමලා අහනකොට ළමයි හිතුවෙ කාට හරි කෝල් කරනව කියලා. ඒත් කණ තියෙන අතරෙ හිනා වෙන ඒවයි තොල් මතුරන ඒවයි මිසක් උත්තර දෙනවා ඇහුණෙ නැති නිසා එක උද්දේක ළමයි හිටියෙ කුතුහලෙන්.

"ගුඩ් මෝනිං සර්" වසන්තිය ඉස්සර වුණා.

"ආයුබෝවන් ළමයො" පොලිටික්ක කිවුවෙ වසන්තියට පෞද්ගලික වන සේ වගේ.

"වෙරි ගුඩ් මෝනිං සර්" අනුරුද්ධියා බැලුවෙ වසන්තියට වඩා වැඩි දෙයක් කියවගන්න.

"හරි, හරි ආයුබෝවන්... ළමයිනේ... මම දැන් එක සැරේකුත් කිවුව නේද?" පොලිටික්කගෙ ප්‍රතිචාරෙට අනුරුද්ධියට උත්තරයක් කටට ආවත් උදේම පැටලෙන එක හොඳ මදි නිසා ඇකිළුවා.

"මොකද්ද සර් සීන් එක... කවුද කෝල් කරල වධ දෙන්නෙ?" මංජුව කිංඩි හිනාවක් දැම්ම.

"කෝල් එනවා නෙමෙයි ළමයිනේ ෆෝන් එකෙන් රේඩියෝ එක අහනව" වෙන නඩුවක් පැටලැවෙයි කියල පොලිටික්ක හැරෙන තැපෑලෙන් ඇත්තම කිවුව.

"දැන් මැච් එකත් නෑනෙ සර්... මොනවැයි අහන්නේ?" කනියටත් ඕන්නැති මඟුලක් නෑ.

"මම මේ අයවැය කතා අහනව" පොලිටික්ක ළඟ නැමුව.

"ඕකෙ අහන්න දෙයක් තියෙනවද සර්?" මංජුව පිළිකුළ පෙන්නුවෙ යටි තොල පෙරළලා.

"ඇයි එහෙම කියන්නෙ?... රජයේ සේවකයින්ට පඩිත් වැඩි කළානෙ" පොලිටික්ක චරිත සහතික ලියනව.

"ඔය දෙන සොච්චම කැළණි පාලම යටින් පොල්ලෙල්ලක් ගියා වගේ කියලනෙ කියන්නෙ" චමිය පොල්ලෙල්ල අතින් යවනව.

"ලබන අවුරුද්දෙ මුල් මාසවල ඒවා දෙන්නෙත් ඔක්තෝබර් පහුවෙලාලු. ඒ කියන්නෙ රනිල්ව දිනෙව්වොත් විතරලු" අනුරුද්දියත් ඇහුණු කතාවක් තමන්ගෙ කරල කිවුව.

"ඕවා ගැවෙන්නවත් මදි වෙයි... ආණ්ඩුව අලුතින් වැට් ගහල අනිත් අතින් ආපහු ගන්න ප්‍රමාණෙ එක්ක බලනකොට..." සමන කිවුවෙ කලිසමේ සාක්කුවට අත් දෙක දාගෙන.

"එහෙනම් සාක්කුවල බොත්තම් හයිකළත් බේරගන්න බැරිවෙයි" කනිය කමිස සාක්කුව අතින් වහගත්ත.

"බොත්තම් නෙමෙයි ඉබ්බො දැම්මත් කඩල හරි ගන්නව" බස්සා කියන්නෙ බලන් හිටිය වගේ. "මහ බැංකුව කියන්නෙ කොච්චර ආරක්ෂාව තිබුණ තැනක්ද? කෝ වැඩක් වුණාද?" බස්සගෙ කතාවට කට්ටියටම හිනා පැන්න.

"ඔය අයවැය කියවන කොට සර්ට ඇහුණෙ නැද්ද හිටපු ජනාධිපතිවරු නඩත්තුවට වෙන් කරන ගාණ වැඩි කළා කියලා" හිනාව මැද්දෙන් කනිය ගේම ඉල්ලුව.

"එයාලටත් සල්ලි වෙන් කරන්න එපෑයෑ" පොලිටික්ක නිදහසට කරුණු කියනව. "කොළේ යන හරකා කොළෙන් කන්න එපායෑ"

"කොළේ යන හරක නම් කොළේ පාගල දෙනව කියන්න පුළුවන්. මේ හරක් මොනව කළාටද නඩත්තු කරන්නෙ?" මංජුවට මල පැන්න පොලිටික්කගෙ කතාවට.

"ඇයි එයාල හිටපු ජනාධිපතිවරුනෙ" පොලිටික්ක සල්ලි වෙන් කරන භාණ්ඩාගාර ලේකම් වගේ.

"ඔව් ඔව් එයාලට වැඩියෙන් වෙන් කරල. දැන් මිලියන 110ක් ගෙඩි පිටින් වෙන් කරල තියෙන්නෙ. 2022ට වඩා 45%කින්ම වැඩි කරලා. පවුනෙ... අහිංසක මිනිස්සු" සමන කියනකොට පොලිටික්ක සැකේට නියෙව්ව. "දැන් බලන්න හේමා නෝනා මදුරු කොයිල් දෙකත් ජනාධිපති ලේකම් කාර්යාලෙන් ඉල්ලගෙ නනෙ ජීවත් වෙන්නෙ. සජිත් මහත්තය වුණත් ඒක දන්නව. ඒ බජට් එක කපනවට කැමති වුණේ නැත්තෙ ඒකනෙ"

"සමන් මොන අදහසින් කිවුවද මම දන්නෙ නෑ. කතාව ඇත්ත. හිටපු ජනාධිපතිවරුන්ටත් ජීවත් වෙන්න විදිහක් තියෙන්න ඕනෙ" පොලිටික්ක කියන්නෙ හැඟීම්බරව.

"සර් කියන්නෙ ඇත්ත. එයාලත් ජීවත් වෙන්න ඕනැනෙ. හම්බ කර ගත්තු දේපළක් නැති... ආදායම් මාර්ගයක් නැති රටේ සාමාන්‍ය මිනිස්සුන්ට පිං පඩියක් දෙනව නම් එයාලටත් දෙන්න ඕනෙ" මංජුව තර්කයක් ගොඩනගනව.

"හැබැයි මෙතන ඉන්න අය සාමාන්‍ය අය නෙමෙයි..." පොලිටික්ක හීනියට කිවුව.

"ඔව් ඒක හරි... මෙයාල සාමාන්‍ය අය නෙමෙයි" සමනට ඩෑෂ් එකක් සෙට් වුණා. "මිනිස්සු හරි ආදරෙයි මෙයාලට... සාමාන්‍ය ජනතාවට බාර දුන්නනම් හොඳට සලකාවි. රට බංකොලොත් කරපු අයනෙ. අධිකරණෙනුත් ඒ බව සහතික කරල තියෙන්නෙ." ඩෑෂ් පාරට පොලිටික්කගෙ මූණ ඇද වුණා.

කවුළුව හැර තබමි

# ඇති වූ එකම දෙය නැතිවීමය...

ලංකාවේ සමාජ අර්බුදය, තැන්පත් දේශපාලන මනසකින් කියවා ගන්නෙකුට වැටහී යන දෙයක් තිබෙයි. එනම් ලාංකේය සමාජයේ බහුතරයක් දෙනා හිතන්නේ 'පෞද්ගලිකව' මිස 'සමාජීයව' නොවෙන බවය. එනිසා ඔහු බොහෝවිට කරන්නේ මේ අර්බුදය ඇතුලේ පුද්ගල කේන්ද්‍රීය ගණන් බැලීම්ය. ඊනියා නිදහස ලැබ වසර 75ක් ගත කළ, වසර 2500ක උදාර සවිමත් සංස්කෘතියකට උරුමකම් කියන්නේ යැයි සම්මත සද්ගුණවත් මිනිසාගේ ඒ ගෙවුණු වසර 75 දිහා බලන විට ඔහු ඉතිරි කරගත් ශේෂ පත්‍රයේ හැම අයිතමයක්ම සෘණ අගයකට හිමිකම් කියයි. මෑත කාලීනව විශේෂත්වය නම්, එම සෘණ අගය ළඟ ළඟම වේගවත් වීමය; වසරින් වසර වේගවත් වීමය.

පුද්ගල කේන්ද්‍රීයව දේශපාලනය ගණන් තබන මිනිසා නිරන්තරයෙන්ම කළේ දේශපාලනය වෙනුවට පුද්ගලයන් මාරුකිරීමය. එම අවිඥානික මිනිසාගේ පිහිටෙන් වත්මන් බලය හොබවන රනිල් රාජපක්ෂ ආණ්ඩුවද 2023 අවසානයට රටට ඉතිරි කර තිබෙන්නේ මොනවාද?

සියලු ආහාර නිෂ්පාදනයන් සෘණ අගයකට පහත හෙළා ඇත. කාර්මික හා කෘෂිකර්මික නිෂ්පාදනයත් එලෙසය. අධ්‍යාපනය නැතිකර ඇත. සෞඛ්‍යය නැත්තටම නැති කර ඇත. බඩු මිල අකනිටා බඹලොවටම නග්ගවා ඇති අතර, පිටි, කිරිපිටි, සහල් ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ අනවශ්‍ය භාණ්ඩ බවට පත්කර ඇත. සීනි 'සිහිනෙන් දිව ගෑ' රසයක් බවට පත්කර ඇත. අවසානයේ ශ්‍රී ලංකාව කියන භෞතික රාජ්‍යයද විකුණාගෙන කමින් නැති බැරි එකාවම චප්ප කර දමන තුරුම ණය බර බදු බර වැඩිකරමින් ශ්‍රී ලාංකීය රාජ්‍යය සංකල්පීය රූපයක් දක්වා වාෂ්ප කෙරෙමින් තිබේ.



අද ලාංකේය මිනිසා සූරාකෑමේ භෞතික සම්මතයට පමණක් නොව විඥානමය සම්මතයටද පාත්‍රවී තිබේ. ලාංකේය සමාජ ව්‍යාපාරයේ කර්තව්‍ය සංකීර්ණ සහ දුෂ්කර වී ඇත්තේද මෙකී ඉහත කී සාධක නිසාය. එහෙත් ඒ අසීරුතාවයෙන් මේ සමාජය ගලවා ගත යුත්තේද ඊටත් වඩා අසීරු ප්‍රයත්නයක් මගින්ම පමණි. ලාංකේය ජනයාට දැනට ඉතිරිව තිබෙන එකම සැනසීම එවන් අභියෝගයකට මුහුණ දිය හැකි සමාජ ව්‍යාපාරයක් මේ භූමිය තුළ සක්‍රීයව පැවතීමය.

# අපරාධය සහ දඬුවම...



ලාංකේය සමාජය මුහුණ දී ඇති වත්මන් අර්බුදයේ මෑතකාලීන වගකිවයුත්තන් මහින්ද, ගෝඨාභය, බැසිල් තුන්බෑ ජටිලයන් ප්‍රමුඛ නඩය බව පසුගියදා මෙරට ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළේය. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව එසේ වුවද රටේ සාමාන්‍ය ජනයාගේ අදහස නම් අදාළ ලැයිස්තුව තවත් විශාල හා පුළුල් විය යුතු බවය; දිගු විය යුතු බවය. මේ තීන්දුව දුන්පසු මහින්ද රාජපක්ෂ නම් අරුම පුදුම ජීවියා අපූරු ප්‍රකාශ දෙකක් කළේය. එකක් මහ දවල්ය. එකක් සවස් භාගයේය. "අපි අධිකරණ තීන්දුවට හිස නමනවා" යන්න, දහවල් එකය. "අපි එම තීන්දුව පිළිගන්නෙ නෑ. අර්බුදයට අපි වගකිව යුතු නෑ" යන්න හවස එකය.

දහවල් කථාවට ඔහු තවත් කෑල්ලක් එකතු කළේය. එනම් "මොකද මමත් නීතිඥයෙක්නෙ" යන්නයි. ඒ ප්‍රකාශයෙන් ඔප්පු වුණේ තමන් ඇතුළු කල්ලිය මේ මහා සාපරාධී අපරාධය කළාය කියා පිළිගැනීමය. ඉන් පැය කිහිපයකට පසු "මේක හරිම ප්‍රශ්නයක් උනානෙ" කියා එක්කෝ ඔහුට සිතෙන්නට ඇත. නැතිනම් ළඟ හිටිය එකෙක් මතක් කර දෙන්නට ඇත. නැවත හතර වටයක් කැරකැවී හවස ප්‍රකාශය කළේ ඒ නිසා විය හැකිය. එසේ නැතිනම් මේ මොහොතේ ජීවත්වන මහින්දගේ ජීව විද්‍යාත්මක තත්වය අනුව අරවිධිහේ දේවල් කටින් පිටවෙනවා විය හැක. අපි ඇත්ත ජීවියා ලෙස හඳුනාගත යුත්තේ දවල් මහින්දට එරෙහිව, හවස මහින්දද නැතිනම් හවස මහින්දට එරෙහිව දවල් මහින්දද? කෙසේ වෙතත් එකක් පැහැදිලිය. ඒ, මේ මහින්දලා දෙදෙනාම ජනතාවට එරෙහිව බවය.

මහින්දලා ප්‍රමුඛ මෙ සාපරාධී නඩය මේ අපරාධය තම පෞදගලික කෝන්තරකාරයෙකුට කළ එකක් නොව, එය දෙකෝටි විසිපන් ලක්ෂයකට ආසන්න, මහල්ලාගේ සිට කිරි දරුවා දක්වාද හෙට උපදීමට පෙරුම් පුරන කිරිකැටි බිළිඳාටද එරෙහිව කළ ලක් ඉතිහාසයේ ලොකුම අපරාධයයි. මේ වියරු පිශාචයින්ට නිසි දඬුවම් දීමට නම් ජනතා පාලනයක් යටතේ ජනතා අධිකරණයක්ම ආ යුතුය.

# නටන නැටුම් - රඟන රැඟුම්...

ටී.වී. එකේ කුකරි වැඩසටහන්වලදී ඊට සහභාගි වන අයම උයාගෙන ඒ අයම එවා අනුභව කරමින් ඒ අයම 'මාර රහයි කියනවා; මාර ගුණයි' කියනවා අපි ඕනෑ තරම් දැක ඇත්තෙමු.

රනිල් කුක්ගේ මෙවර අයවැයත් එලෙසමය. රසත් උන්ටය; ගුණත් උන්ටය; කෑමත් උන්ටය. ලෙව කෑමටවත් දෙයක් නැත්තේ ජනතාවටය. මේ අපේ කථාව අයවැය ගැන ශාස්ත්‍රීය එකක් නොවේ. හිටපු ජනාධිපතිවරුන්ගේ නඩත්තු සඳහා වෙන්කර ඇති වැය ශීර්ෂ ගැන සරල රසවත් කථාවකි. ගියවර (2023 වෙනුවෙන්) එය කෝටි 08කි. මෙවර (2024 වෙනුවෙන්) එය කෝටි 11කි. මෙම වැය ශීර්ෂවලට අදාළ අයවැය විවාදයේදී අපේ අනුර සහෝදරයා අපූරු තර්කයක් මතු කළේය. ඒ, රාජපක්ෂ ජනාධිපතිවරු ගැනය. 'මේ රට මේ අගාධයට ඇද දැමීමට වගකිවයුත්තන් ඔවුන් බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කර තිබියෙදීත් එම අපරාධකරුවන් තවදුරටත් නඩත්තු කිරීමට ජනතාවගේ රීරි මාංශ උරාගෙන අයකරන බදු මුදල් වැය කරන්නේ ඇයි?'දැයි ඔහු අසා තිබිණි. එනිසා ඒ සඳහා වහාම පාර්ලිමේන්තු ඡන්ද විමසීමක් පැවැත්විය යුතු බව අනුර සහෝදරයාගේ ඉල්ලීම විය. ඒ අනුව ඡන්ද විමසීමක් පවත්වන ලදී. එම යෝජනාවට පක්ෂව ඡන්දය දුන්නේ ජාතික ජන බලවේගය නියෝජනය කරන මන්ත්‍රීවරු තිදෙනා පමණි. මෙහි "කොමඩි ජනක" පාට් එක නම්, උදේ සිට රෑ එළිවෙනතුරු අයවැය පතුරු ගැසූ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස අර වැය ශීර්ෂයට එරෙහි ඡන්ද විමසීමේදී පාර්ලිමේන්තුවේ පැත්ත




පළාතකවත් නොසිට දිරාමාරු වී යාමය. කොමඩියේ ඊළඟ පාට් එක නම් ආර්ථික ඝාතකයන් වූ රාජපක්ෂලාගේ ප්‍රජා අයිතිය අහෝසි කරන්නය කියා ඊට පසුවදාම කොටුව ස්ටේෂම ළඟදී සජිත්ගේ නායකත්වයෙන් පෙත්සමක් අත්සන් තැබීමය. සජිත්ගේ මවටත්, හිටපු ජනපති ආර්යාව හැටියට අයවැයෙන් ලොකු නඩත්තු මුදලක් වෙන්කරන බව අතිරේක වශයෙන් මෙහිලා සටහන් කර තබමු. මේ රඟන රැඟුම් නටන නැටුම් අවසන් කරන්නේ කවදාද? අපි එය ජනතාවට භාරකරමු.

# මේ අයවැය ලේඛනයෙනුත් පෙන්නුම් කරන්නේ පැවති විනාශකාරී ගමනමයි

*(2024 අයවැය දෙවන වර කියවීමේ විවාදයට එක් වෙමින්)*


ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු කණ්ඩායම් නායක
**අනුර දිසානායක සහෝදරයා**

රාජපක්ෂවරුන්ට අපේ දේශපාලන විරෝධය තිබෙන්නේ ඔවුන් යුද්ධය අවසන් කොට අපේ රටට විශාල සුද්ධයක් දීපු නිසා. ඒ සුද්දයේ ප්‍රමාණයත් ඒ සුද්දයනට හවුල් වූ අයත් මේ ආර්ථිකය මේ ආකාරයට කඩා වැටීමට මොනතරම් ප්‍රමාණයකින් හේතු වුණාද කියන්න පුළුවන්. ඒ වගේම ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබාදී තිබෙන තීන්දුවේ හරයෙන් පෙන්නුම් කරන්නේ අවශ්‍ය අවස්ථාවේදී ගතයුතු ආර්ථික තීන්දු වෙනුවට වෙනත් ආර්ථික තීන්දු ගැනීම නිසා මේ රට විශාල ආර්ථික කඩා වැටීමකට ලක්වුණු බවයි.

2019න් පසු ගනු ලැබූ තීන්දු පමණක් නොවෙයි, දීර්ඝ කාලයක් නිශ්චිත මොහොතේ ගත යුතුව තිබූ ආර්ථික තීන්දු නොගැනීමත්, ගනු ලැබූ වැරදි ආර්ථික තීන්දු විසිනුත් මේ අර්බුදය නිර්මාණය කර තිබෙනවා. 2015 සිට 2019 ආසන්න කාලය ගතහොත් අපේ රටේ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර මිලදී ගැනීම ඩොලර් බිලියන දොළහමාර දක්වා වර්ධනය වුණා. ඒ වර්ධනය වීම ආර්ථික අර්බුදයේ හා විදෙස් ණය ගෙවා ගැනීමේදී මතුවූ අර්බුදයේ ප්‍රධානම කොටසක් බවට පත්වී තිබෙනවා. රනිල් වික්‍රමසිංහ මුදල් අමාත්‍යවරයා අයවැය ලේඛනය ඉදිරිපත් කරන කොට ඉතිහාසය පිළිබඳව පුනරුච්චාරණයේ යෙදෙනවා. නමුත් 2000 වසරේ සිට මේ දක්වා කාලය බැලුවොත් කාලයෙන් තුනෙන් එකක් රනිල් විසින් මේ රට මෙහෙයවා තිබෙනවා. ඔහු කියනවා මේ ආර්ථිකයත්, ආර්ථික දේහයත් මුළුමනින්ම 'කොට්ට උරයක් අනෙක් පැත්ත හරවා කණපිට ගසන්නා සේ' කණපිට ගැසිය යුතුයි කියලා. මොහු දෙපාරක් මේක කියා තිබෙනවා. මීට පෙරත් ඔහු කොට්ට උරේ කණපිට ගැහුවා. දැන් ආයේ මේ බජට් එකෙනුත් කොට්ට උරේ කණපිට ගහපුවහම තිබුණු පැත්තමයි මතුවී පෙනෙන්නේ. මේ අයවැය ලේඛනයෙනුත් පෙන්නුම් කරන්නේ පැවති විනාශකාරී ගමනම තමයි.

එසේ නම් අපට නව ආර්ථික සැලැස්මක් අවශ්‍යයි. රටක් හැටියට රුපියල් අර්බුදයෙන් ගොඩඑන්නේ කොහොමද කියා සැලසුමක් අවශ්‍යයි. රටක් හැටියට අපි ඩොලර් අර්බුදයක ඉන්නවා. වාර්ෂිකව අපි උපයා ගන්නා ඩොලර් ප්‍රමාණය වාර්ෂිකව අපිට අවශ්‍ය වන ඩොලර් ප්‍රමාණයට වඩා විශාල වශයෙන් අඩුවී තිබෙනවා. ඒ නිසා රටට අවශ්‍ය ඩොලර් සහ රුපියල් ප්‍රමාණය උපයා ගත හැකි ආර්ථික වැඩපිළවෙළක් අපිට අවශ්‍යයි. එහිදී අපට වැදගත් කාර්යයක් පැවරෙනවා. අපි විදේශයෙන් අරන් තිබෙන ඩොලර් ණය අපි නියමිත පරිදි යෙදෙව්වාද කියන ප්‍රශ්නය පැන නගිනවා. අපට ඕන තරම් ව්‍යාපෘති තිබෙනවා. අපි විදේශයෙන් ගත් ණය ගෙවා ගැනීමට සමත් වෙන ආර්ථික ව්‍යාපෘතිවල යොදා ගන්න අපි අසමත් වුණා. එසේ නම් අපි අනාගතයේදී ඩොලර් ආයෝජන කැඳවිය යුතු වන්නේ අපේ ඩොලර් ප්‍රමාණය උත්පාදනය කර ගැනීම සැලසුම් කොට ගත්ත විදෙස් ආයෝජනවලටයි. අපි විදෙස් ආයෝජනයට පක්ෂපාතියි. සමහර රටවල තාක්ෂණය නැහැ. මේ තාක්ෂණය ගෙන්වා ගැනීම සඳහා අපිට ආයෝජනයන් අවශ්‍යයි. සමහර විට අපිට තාක්ෂණය තිබුණත්, ප්‍රාග්ධනය නැහැ. ඒ නිසා මේ ප්‍රාග්ධනය සහ තාක්ෂණය කැඳවා ගැනීම සඳහා අපි අයෝජනය ගේන්න ඕනෑ.

අපි වැඩි අවධානයක් යොදා විදේශීය ආයෝජන කැඳවිය යුත්තේ, ඩොලර් උත්පාදනය කිරීම අරමුණු කරගෙනයි. මේ අයවැය ලේඛනයේ කොතනකවත් ශක්තිමත් විදෙස් ආයෝජන කැඳවීම සඳහා සැලැස්මක් නැහැ. ඔහුට තිබෙන සැලැස්ම තමයි විකිණීම. ආණ්ඩුව සැලසුම් කර තිබෙනවා ලංකා බැංකුවේ කොටස් වෙළඳපොළට නිකුත් කරන්න. 2022 ලාභය මිලියන තිස්දහස් නමසිය අනූහතයි. ගිය අවුරුද්දේ මහජන බැංකුවේ ලාභය, විසි එක්දහස් තුන්සිය තිස් අටයි. අපි සමාග මවලට කොටස් නිකුත් කරනවා කියන්නේ ඒ ලාභය ඩොලර් කරගෙන ගෙනයනවා. මූල්‍ය වෙළඳපොලේ කාර්යක්ෂමතාවය සඳහා පෞද්ගලික අංශ කැඳවිය යුතු නම්, ඒ තරගකාරිත්වය දිය හැකි බැංකු කෂේත්‍රයේ පෞද්ගලික සමාගම විශාල ප්‍රමාණයක් තිබෙනවා. සමහර ක්ෂේත්‍රවල ඒකාධිකාරිත්වය බිඳින්න පෞද්ගලික සමාගම්වලට ආරාධනා කරනවා කියන්න පුළුවන්. නමුත් ආණ්ඩුව ඒකාධිකාරිත්වය බිඳ වෙළඳපොළ තරගයක් නිර්මාණය වී තිබෙන මූල්‍ය ක්ෂේත්‍රත් අත්හරින්න හදනවා. ඒ නිසා මූල්‍ය වෙළඳපොළ අපේ ආර්ථිකයේ විශාල සංවේදීතාවයක් හදනවා. ඒ නිසා මූල්‍ය කෂේත්‍රයේ පංගුවක් අනිවාර්යයෙන් ආණ්ඩුව සතුව තිබිය යුතුයි.

> අද ලෝකයේ බලවතා තාක්ෂණයේ ආධිපත්‍යය දරන කෙනා. එයා තමයි ලෝකයේ ශක්තිමත් ආර්ථිකයට උරුමකම් කියන්නේ. ඒ නිසා ලෝකයේ සෑම තැනම පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා විශාල වැය ශීර්ෂයක් දරනවා. එක තැනම පල්වෙමින් පැරණි ආර්ථියක් ගැනම කතා කරමින් ඉස්සරහට යන්න බැහැ. නවෝත්පාදනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරලා ලෝකයේ පිම්මක් ගන්න ඕනෑ.

මේ ආර්ථිකය කඩා වැටීමට හේතු සාධක මොනවාද කියා ඇසුවොත් සැමකෙනෙක්ම එක හඬින් කියන්නේ රටේ වංචාව, දූෂණය, නාස්තිය හේතු වුණා කියන එක. මේ වංචාව, දූෂණය, නාස්තිය නතර කිරීමට හෝ අවම කිරීමට සඳහාවත් වැඩපිළිවෙළක් නැහැ. වංචාව, දූෂණය, නාස්තිය නතර කිරීමකින් තොරව අපේ රට පත්වී තිබෙන අර්බුදයෙන් ගොඩගන්න බැහැ. භාණ්ඩාගාරයේ සල්ලි අඩු වුණේ ඇයි? භාණ්ඩාගාරයට එන්න තිබෙන ධනය ගෙවල්වලට හැරෙව්වා. මේ භාණ්ඩාගාරයට ආ යුතු ධනය නිසි පරිදි ගලාගෙන ඒම සඳහා සැලැස්මක් හදන්න ඕනෑ. ඒකට අයවැයේ කිසිදු සැලැස්මක් නැහැ. භාණ්ඩාග ාරයට එන ධනය වැඩි කරන්න ඕනෑ. භාණ්ඩාගාරයට ධනය ගලාගෙන එන සැලැස්මක් තිබෙන්න ඕනෑ. වංචාව, දූෂණය, නාස්තිය නතර කිරීම සඳහා සැලැස්මක් හැදිය යුතුව තිබුණා. අපේ රට ගොඩනැගීමේ පළමු පදනම මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමයි.

භාණ්ඩ හා සේවා වෙළඳපොලේ පරිවර්තන ඇති වෙන්නේ නව තාක්ෂණය සහ නවෝත්පාදන ක්ෂේත්‍රයන් හරහා. ඒ නව තත්වයන්ට අවශ්‍ය වෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමට අපි සැලැස්මක් හදන්න ඕනෑ. අපේ පාලකයන්ට එහෙම සැලැස්මක් තිබුණේ නැහැ. අපේ පාලකයා හැමදාම විශ්වාස කළේ තේ, රබර්, පොල්. අපේ පාලකයන් පැරණි, තේ, රබර්, පොල් හා සමාන ලෙසම පැරණියි. ඒ නිසා ලෝකයේ ඇතිවන නව තත්වයන් තේරුම් අරගෙන ඒ තත්වයන්ට අවශ්‍ය වන භාණ්ඩ හා සේවා වෙළඳපොළක් අත්පත් කර ගැනීම සඳහා සැලැස්මක් අපට අවශ්‍යයි.

අද ලෝකයේ බලවතා තාක්ෂණයේ ආධිපත්‍යය දරන කෙනයි. එයා තමයි ලෝකයේ ශක්තිමත් ආර්ථිකයට උරුමකම් කියන්නේ. ඒ නිසා ලෝකයේ සෑම තැනම පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා විශාල වැය ශීර්ෂයක් දරනවා. එක තැනම පල්වෙමින් පැරණි ආර්ථියක් ගැනම කතා කරමින් ඉස්සරහට යන්න බැහැ. නවෝත්පාදනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරලා ලෝකයේ පිම්මක් ගන්න ඕනෑ. දකුණු කොරියාව, තායිලන්තය, මැලේසියාව, ඉන්දියාව මේ සංවර්ධනයේ පිම්ම අරගෙන තිබන්නේ. නවෝත්පාදන, නව තාක්ෂණයක් වර්ධනයන් හරහා තමයි ඔවුන් මේ පිම්ම ගත්තේ.

දෙවනුව බලශක්ති ක්ෂේත්‍රය, කෙරෙහි අවධානය යොමු කළ යුතුව තිබෙනවා. අපේ විදුලිබල පද්ධතියේ අපි තාම පාවිච්චි කරන සමහර ඒවා ඩීසල්, සමහර ඒවා දැවිතෙල්. දැවි තෙල්වලින් විදුලි ඒකකයක් හදන්න රුපියල් 53කට ආසන්න ප්‍රමාණයක් වෙනවා. ඩීසල් හදන්න රුපියල් 73ක් යනවා. සමහර ඩීසල් බලාගාරවලින් විදුලිය හදන්න රුපියල් 110ක් යනවා. ඒ නිසා මේ පද්ධතියම ඉක්මනින්ම එල්.එන්.ජී. බලාගාරවලට පරිවර්තනය කරන්න තිබුණා. එතන මෙගාවොට් 1000කට වඩා වැඩි විදුලි පද්ධති ධාරිතාවක් තිබෙනවා. අද එල්.එන්.ජී. මිලත් එක්ක බැලුවොත් විදුලි ඒකකයක් රුපියල් 28ත් 30ත් අතර උත්පාදනය කරගන්න පුළුවන්. අයවැය ලේඛනයේ එතනට යෝජනාවක් කෝ?

ඊළඟට අපි ආර්ථිකය වර්ධනය කරන්න ප්‍රධාන තැන් දෙකන් එකක් ධීවර කර්මාන්තය. අද ධීවර ප්‍රදේශවල බහුජන යාත්‍රා 50% ක් මුහුදට යවන්නේ නැහැ. මේ මිලට තෙල් ගහලා, බඩු අරගෙන බහුදින යාත්‍රා යවලා අල්ලන මාළු තොගය ගෙනාවාම යාත්‍රාවට පාඩුයි. ඒ මුහුදේ මාළු සම්පත නෙළා ගන්න බැරුව බහුදින යාත්‍රා ගාල් කර තිබෙනවා. අයවැය ලේඛනයේ යෝජනාවක් තියෙන්න තිබුණා, මේ ගාල්කරලා තිබෙන බහුදින යාත්‍රා ටික කොහොමද මුහුදට යවන්නේ කියලා. එවැනි සැලැස්මක් ඔවුන්ට නැහැ.

අපේ රටේ නිෂ්පාදනය පිළිබඳ සැලකිල්ලක් කරනවා නම් කෘෂිකර්මාන්තය මීට වඩා සැලකිල්ලට ලක් කළ යුතු ක්ෂේත්‍රයක්. අපි, තාක්ෂණයෙන් හා බීජවලින් කෘෂි කර්මාන්තයේ විශාල පසුබෑමක ඉන්නවා. නව පර්යේෂණයන් සහ නව නිෂ්පාදන මගින් අපි කෘෂිකර්මාන්තයේ නව සංවර්ධනයක් අත්පත් කරගත යුතුයි. අපේ කෘෂිකර්මාන්තයේ ඵලදායීතාවය වැඩිකර ගැනීම සඳහා සැලැස්මක් අවශ්‍යයි. අපේ බීජ වෙළඳපොළ විශාල ලෙස කඩා වැටිලා. පැරණි ආර්ථික උපායමාර්ගය වෙනුවට අපේ රටේ භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය මත පදනම් වුණු නව ආර්ථික උපායමාර්ගයකට යා යුතුයි. නව තාක්ෂණය නව වෙළඳපොළ ලෝකයේ ඇතිවන නව තත්වයන්, නව වෙළෙඳපොළ විවෘත වන ප්‍රමාණයන්, තාක්ෂණයේ ඇතිවන වර්ධනයන් මේ සියල්ල උකහා ගත් නව ආර්ථික සැලැස්මකට පරිවර්තනය කිරීමකින් තොරව භාණ්ඩාගරයට රුපියල් හම්බවෙන්නෙත් නැහැ; රටට ඩොලර් හම්බ වෙන්නෙත් නැහැ.

## ආණ්ඩුව...

03 පිටුවෙන්

අර්බුදත් විසින් රටේ දේශපාලන අර්බුදයක් හා අරාජිකත්වයක් නිර්මාණය කොට තිබේ.

මේ විනාශකාරී ආර්ථික අර්බුදයෙන් මෙන්ම වර්තමාන දේශපාලන අර්බුදයෙන් හා අරාජිකත්වයෙන් මේ රට මුදා ගත හැක්කේ වර්තමාන පාලනය පරාජය කර ජනතාවාදී පාලනයක් ගොඩනැගීම මගින් පමණකි. ඒ සඳහා අපේ රටේ ජනතාව ඉදිරියේ තව ඇත්තේ උපරිම මාස 10කටත් අඩු කාලයකි. එම අවස්ථාව නිවැරදිවම යොදා ගැනීම ජනතාවගේ වගකීම වේ.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් හමුවී...



ඉන්දියානු මහ කොමසාරිස් හමුවී...



ලෝක සාම මණ්ඩලයේ නියෝජිතයන් සමග...



වෘත්තීයවේදීන්ගේ ගැටලු විමසමින්...



පලස්තීන සහයෝගිතා දිනය සැමරීමට එක්වී...



Communists of Russia පක්ෂය සමග හමුවක්...




# ජනතා අපේක්ෂා ඉටුකරන පාලනයක් වෙනුවෙන් ඉල්මහ විරුවන්ගේ ආධ්‍යාත්මය අපට අවශ්‍යයි



ජනතා විමුක්ති පෙරමුණ නායක
අනුර කුමාර දිසානායක සහෝදරයා

ලාංකේය සමාජය දශක ගණනාවක් ආණ්ඩු පිහිටුවා යහපත් සමාජ පරිවර්තනයක් අපේක්ෂා කළ නමුත් ඔවුන් රැවටීමට ලක්වී අසරණභාවයට වැටී ඇති බවත් අපේක්ෂාභංගත්වයේ පතුළටම තල්ලු වී සිටින බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, එවැනි ජනතාවක් යළි රැවටීමට කිසිවෙකුටත් අයිතියක් නොමැති බවත් ජනතා අපේක්ෂා ඉටුකරන පාලනයක් වෙනුවෙන් ඉල්මහ විරුවන්ගේ ආධ්‍යාත්මය අවශ්‍ය වන බවත් අවධාරණය කළේය.

අනුර දිසානායක සහෝදරයා මේ බව ප්‍රකාශ කළේ පසුගිය 13වැනි දින මහරගම තරුණ සේවා සභා ශ්‍රවණාගාරයේ පැවති 34වැනි ඉල්මහ විරු සමරුවේ සමරු දේශනය පවත්වමිනි.


මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"අපි ජනතාවට අවංකවම ආදරය කරන්න ඕනෑ. ඔවුන්ගේ අපේක්ෂාවන් මුදුන්පත් කරගැනීම සඳහා අපි අවංකවම වැඩ කරන්න ඕනෑ. පතුලෙන්ම එන අවංකභාවයෙන් අපි පෝෂණය වෙන්න ඕනෑ. අන් කවරාදාටත් වඩා වැඩියෙන් මේ ව්‍යාපාරයට සාමූහිකත්වය අවශ්‍යයි. දේශපාලන ජයග්‍රහණයක් තුළ අපේ පංගුව අත්කර ගැනීම සඳහා ගොඩනැගිය හැකි මානසිකත්වය දැන් තබාම අත්හැරිය යුතුයි. ඒ සෑම තැනකම තිබෙන්නේ අපි හැමෝගෙම සාමූහික කොටස්. ජයග්‍රහණ අත්කර ගත හැකි වන්නේ, මහා මිනිස් සමාජයට නායකත්වය දියහැකි හැකියාවන් සහ දක්ෂතාවයක් තිබෙන කොටස් උරා ගැනීමෙනුයි.

අපි මේ ඉල්මහ සමරුව සමරන්නේ ඉතාමත් වැදගත් ඓතිහාසික අවස්ථාවක. සමාජය පරිවර්තනය කිරීම සඳහා මහා හඬක් රට තුළ පමණක් නොවෙයි, එක්සත් ජනපදයේ සිටින ලාංකිකයින් තුළ පවා පවතින මොහොතක. ඒ ලාංකිකයන් වඩා උසස් ජීවිතයක් ගත කළත්. අප කෙරෙහි විශාල බලාපොරොත්තු තබාගෙන සිටිනවා. අපේ වගකීම ඒ බලාපොරොත්තු යථාර්ථයක් බවට පත්කිරීමයි. මේ රට පරිවර්තනය කිරීමට සමත් ව්‍යාපාරයක් අපට තිබෙන බව අපි දන්නවා. ඒ ධෛර්යයෙන් සතුරා ඉදිරියේ ඉන්ද්‍රඛීලයක් සේ නොසැලී සිටිය හැක්කේ දේශපාලන ව්‍යාපාරයේ තිබෙන බලයෙන්. ජාතික ජන බලවේගය හැටියට පොදු ජනයා සංවිධානය කිරීමට අපි විශාල වැඩකොටසක් කරගෙන යනවා. එම ව්‍යාපාරයට ආධ්‍යාත්මය කැඳවීමේ බලය ජනතා විමුක්ති පෙරමුණ හැටියට අපි භාරගන්න ඕනෑ."

# අපේ අදූෂිත බව සතුරන්ට අභියෝගයක් වී තිබෙනවා

ජනතා විමුක්ති පෙරමුණේ
ප්‍රධාන ලේකම්
ටිල්වින් සිල්වා සහෝදරයා



ජාතික ජන බලවේගයට කැමති වෙන්නන් එයට කැමති වීමට ප්‍රධානම හේතුව අදූෂිත දේශපාලන ව්‍යාපාරයක් වීම බව සමීක්ෂණයකින් පවා හෙළි වී ඇති බවත් දූෂිත නොවී සිටීම විහිළුවක් වූ සමාජයක ඒවා දරාගෙන ආදර්ශ දීම පහසු කටයුත්තක් නොවන බවත් හොරකම් කළ විට විහිළු නොකරන නමුත් හිතවතෙකුගෙන් පරිත්‍යාගයක් ලැබීම විහිළුවට ලක්වූ සමාජයක ජනතා විමුක්ති පෙරමුණ අදූෂිත සංස්කෘතියක් නිර්මාණය කර තිබෙන බවත් ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, මේ වන විට සතුරන්ට ජනතා විමුක්ති පෙරමුණේ අදූෂිත බව අභියෝගයක් වී තිබෙන බව අවධාරණය කර සිටියේය.

ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 13වැනි දින පැවති ඉල්මහ විරු සමරුවේදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද පැවසීය.

"ඔවුන් උත්සාහ කරන්නේ ඔවුන් දූෂිත නිසා ජේ.වී.පී. එකත් දූෂිතයි කියලා සමාජ මතයක් හදන්න. ඒ වෙනුවෙන් නිර්මාණය කළ ඇතැම් ප්‍රවෘත්තිවලට එරෙහිව අපි ක්‍රියාමාර්ග අරගෙන ඒවා නිර්මාණය කරපු අයට සමාව ගන්නත් සිදුවුණා. විශේෂයෙන්ම අනුර සහෝදරයා ඉලක්ක කරගත් මඩ ව්‍යාපාරයක් දියත් කර තිබෙනවා. ඔවුන් එකිනෙකා අතර අවලාද බෙදා ගනිමින් මේ ගෙනයන මඩ ව්‍යාපාරයෙන් ලේවලින් බැඳුණු අපේ සහෝදරත්වය බිඳින්න බැහැ. අපේ ජීවිතයේදී එකතු කරගත් හොඳම දේවල් පක්ෂයට එකතු කරමින් පැමිණි ගමනේ මහජන කැමැත්ත මත බලය ගැනීමේ ඉලක්කයට අප ළං වී සිටිනවා.

ඉල්මහ විරු සමරුවේදී ඒ සහෝදර සහෝදරියන් අපට ලබාදී තිබෙන අත්දැකීම්, පරමාදර්ශයන්, සහ ඔවුන්ගේ අරමුණු අනුව වඩා යහපත් සමාජයක් නිර්මාණය කරන්න කැප වෙනවා. ඉතා නුදුරු දිනයකදී ඔවුන්ගේ බලාපොරොත්තු මේ මහ පොළොවේ මල් ඵල ගන්වන දිනයක් එනවා. එය දූෂිතයන්ට, රනිල් වික්‍රමසිංහලාට, මහින්ද රාජපක්ෂලාට වළක්වන්න බැහැ. ඒ වෙනුවෙන් එකාවන්ව සංයමයෙන්, ඉලක්ක සහිතව, බොරුවලවල්වලට පය නොතබා, වඩාත් සටන්කාමීව මේ ගමන යන්න අපි ශක්තිමත් වෙන්න ඕනෑ. රෝහණ සහෝදරයා කිවුවේ මේ යුගයේ ප්‍රබලතම අවිය 'අදහස්වලින්' සටන් කිරීමයි කියලා. රනිල් වික්‍රමසිංහලා, මහින්ද රාජපක්ෂලා අදහස්වලින්, මතවාදයෙන් පරද්දලා ඉවරයි. දැන් තිබෙන්නේ රාජ්‍ය බලයෙන් පරද්දවන්න. ඒ වෙනුවෙන් ඉල් සමරුවෙන් ගත හැකි වටිනාකම් තිබෙනවා.

අපි ජීවත් වෙන්නේ ඉතාමත් විනාශකාරී නරුම සමාජයක. හැම දේකම මිල දන්නා, වටිනාකම් නොදන්නා සමාජය වෙනස් කර, මේ රට අපට ජීවත් විය හැකි හොඳ රටක් බවට පත්කිරීමේ අරමුණ ජයග්‍රහණය කරන්න ඕනෑ. තිස් හතරවෙනි ඉල්මහ සමරුවේදී අපි හැමදෙනාම අධිෂ්ඨාන කර ගනිමු, තිස්පස්වැනි ඉල්මහ සැමරුම මහජන පාලනයක් තුළ සමරන්න."





බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.